# ප්‍රතිපත්ති ප්‍රකාශනය

අති ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ජනාධිපති

1995

BKT. 000
25.08.2023

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

පාර්ලිමේන්තුවේ

නව සැසි වාරය විවෘත කරමින්

ජනාධිපතිනි

**ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය**

1995 ජනවාරි 6 වැනිදා කළ

# ප්‍රතිපත්ති ප්‍රකාශය

## පාර්ලිමේන්තුවේ නව සැසි වාරය විවෘත කරමින් ජනාධිපතිනි ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය 1995 ජනවාරි 6 වැනිද කළ ප්‍රතිපත්ති ප්‍රකාශය

ගරු මන්ත්‍රීවරුනි,

1994 වර්ෂය ශ්‍රී ලංකාවේ අප හැම දෙනාටම අති විශේෂ වැදගත් කමකින් යුත් වසරකි. අවුරුදු දශක දෙකකට ආසන්න කාලයක් තිස්සේ පැවතුණු දූෂිත, පීඩාකාරී සහ විනාශකාරී ආණ්ඩුවක් යටතේ අපේ රටේ ජනතාව දක්වා තිබෙන්නේ විශ්මය ජනක ආත්මගරුත්වයක් හා පරිණත බවකි. ඔවුන් ජීවත් වූයේ ඉතාම කුරිරු ලෙස මූලික මිනිස් අයිතිවාසිකම් පාගා දමා තිබුණු යුගයකයි. කිසිදු ජාතික අරමුණක් නැති ඊනියා ආර්ථික සංවර්ධනයේ නාමයෙන් ජාතික සම්පත් හිතුමතේ කොල්ලකෑ, ඇටමිදුළු දක්වා කුණුවී දූෂිතව පැවතුණු රාජ්‍ය ව්‍යුහයක් යටතේයි. මෙම කොල්ලකාරී ඊනියා සංවර්ධනය වරප්‍රසාද ලත් ටික දෙනෙකු පොහොසත් කරමින් අන් හැම දෙනාම කොතරම් අන්ත දුගී තත්වයකට ඇද දමා තිබුණාද කිව හොත්, ජනගහණයෙන් බහුතරය ඉපයුවේ 1977 දී ඔවුන් ඉපයූ ආදායමට වඩා සාපේක්ෂ වශයෙන් අඩුවෙනු යි.

අපේ ජනතාව අවුරුදු 17ක දීර්ඝ සහ දුෂ්කර කාලයක් පුරා මෙම තත්වය ඉතා ඉවසීමෙන් දරා ගෙන සිටියාහ. 1994 වර්ෂයේදී වැදගත් ඓතිහාසික මොහොතවල් තුනක්ම මතුවිය. මෙහිදී සිදුවූයේ එවකට තිබුණු ආණ්ඩුවේ දේශපාලන ත්‍රස්තවාදය, දූෂණය, හිතක් පපුවක් නැතිකම සහ අකාර්යක්ෂමතාවය යන මේවාට විරුද්ධව ජනතාවගේ විරෝධය උතුරා ගොස් ප්‍රකාශයට පත්වීමයි. ඒවායින් ප්‍රකාශයට පත්වුනේ වෙනසක් සඳහා වූ, එනම් ශ්‍රී ලංකාවේ සමාජයේ සෑම ජන කොටසකටම අර්ථවත් වන සහ සාධනීය වෙනසක් සඳහා ජනතාව වෙත තිබූ, නොසිඳෙන ධෛර්යය සහ අභිලාශයයි. මෙය භීෂණයේ සහ පීඩනයේ පාලනය

අවසන් කර, නීතියේ ආධිපත්‍යය ඉතා දැඩි ලෙස ප්‍රතිෂ්ඨාපනය කර, සැබෑ ලෙසම ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා වූ වෙනසකි. එමෙන්ම නිෂ්පාදනය සහ සේවා නියුක්තිය වැඩි කරන ගමන්ම උද්ධමනය පහත දමමින් ජනතාවගේ මූර්ත ආදායම් තත්වයන් ඉහල නංවමින්, සමාජ සාධාරණත්වය සහ සමානත්වය යන අරමුණු වලට වැදගත් කමක් දෙන තිරසාර සහ ස්ථාවර ආර්ථික සංවර්ධනයක් සිදු කිරීම අපේක්ෂා කොට ගත් වෙනසකි.

ඒ සමඟම අපේ රටේ උතුරු නැගෙනහිර සිදුවන යුද්ධය අවසන් කොට සාමය යලි ගොඩනැගීම සඳහා තමන් තුල ඇති ශක්තිමත් සහ අව්‍යාජ අභිලාශයත්, ජනතාව පැහැදිලිව සහ මහ හඩින් ප්‍රකාශයට පත් කළහ.

මේ අරමුණු වෙනුවෙන්, මාස දහ අටක් තුළ පැවැත්වූ ප්‍රධාන මැතිවරණ හතරකදීම අපේ ජනතාව දක්වා තිබූ නොසැලෙන සහ ස්ථිර සාර කැපවීම පුදුම එළවන සුලුයි. ඊටත් වඩා විශ්මය ජනක දෙයනම්, අපේ රටේ සමස්ත සමාජ සහ දේශපාලන දේහයම අබල දුබල කළ රාජ්‍ය ත්‍රස්තවාදය සහ දූෂණයෙන් පිරි දශක දෙක තුළ පවා මෙම කැපවීම නොසැලී, නොකැඩී තිබීම යි.

පසුගිය නොවැම්බර් මාසයේ පැවැත්වූ ජනාධිපති මැතිවරණයේදී කුළු ගැන්වී ප්‍රකාශයට පත්වුණු ජනතාවගේ උණුසුම් හැඟීම් පිළිබඳව මගේ ආණ්ඩුව පළකර සිටින්නේ ඉතා නිහතමානී සතුටකි. මේ ජයග්‍රහණය ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයේ වෙන කිසි තැනක සිදුනොවූ ආකාරයේ විශාල ජයග්‍රහණයකි. ජනතාව අප වෙත තබා ඇති විශ්වාසයේ පරිමාව ගැනත්, ඒ වෙතින් පැන නගින අති මහත් බලාපොරොත්තු පිළිබඳවත්, අපි ඉතා තියුණු අවබෝධයකින් සිටින්නෙමු. අපේ රටේ ජනතාව අප වෙත තබා ඇති මෙම අසාමාන්‍ය සහ බරපතල වගකීම ඉටු කිරීමට, අප සතු හැකියාවන්, බුද්ධිය, අවංකකම, ඍජු බව සහ කාර්යක්ෂම බව උපරිම ලෙස මෙහෙයෙහි යොදා කටයුතු කිරීමට මගේ ආණ්ඩුව කැප වී තිබෙන බව කියන්නට මම කැමැත්තෙමි. ව්‍යුහාත්මක වශයෙන් නිවැරදි සහ ස්ථිර සාර ප්‍රතිපත්ති මාලාවක් අප විසින්

සකස් කර තිබේ. අපේ මෙම ප්‍රතිපත්ති පුරා විහිදෙන සහ ඒවාට හරයාත්මක අර්ථයක් සපයන එක් කේන්ද්‍රීය තේමාවක් ඇත. එනම් දේශපාලන බලය පාවිච්චි කළ යුත්තේ ආණ්ඩුව සහ ජනතාව අතර ඇති සමාජ ගිවිසුමේ මූලික මූල ධර්මවලට භක්තිමත්ව කැපවීමේ ජීව ගුණය ඇතුළතය යන අප වෙත ඇති නොසැලෙන විශ්වාසය යි. මගේ ආණ්ඩුවේ ආකල්පය නම්, දේශපාලන බලය යනු ජනතාව විසින් අප වෙත පවරා ඇති භාරකාරත්වයක්ය යන්නයි. දේශපාලන බලය සදාචාරාත්මක ලෙස සාධාරණය කළ හැක්කේ එය ප්‍රජාවගේ සුභ සිද්ධිය වැඩි දියුණු කිරීමේ අරමුණ සඳහා යොදා ගන්නේ නම් පමණි. මුළු ජනතාවම අපේ ආණ්ඩුවෙන් අපේක්ෂා කරන්නේ මෙය ඉටු කිරීමයි. අපි ජනතාවගේ මේ විශ්වාසය කඩ නොකරන්නෙමු.

මාස හතර හමාරකට පෙර අප ආණ්ඩුව භාර ගත්විට අප කෙළේ හුදෙක් රට ආණ්ඩු කිරීමේ කාර්යය භාර ගැනීම පමණක් නොවේ. අපට භාර ගැනීමට සිදුවූයේ කණපිට පෙරලා තිබුනු රටකි. රාජ්‍ය ත්‍රස්තවාදය, දූෂණය සහ අනුකම්පා විරහිතකම නිසා හඳුනාගැනීමටත් නොහැකිවන ලෙස කිලිටිවී, අංග විකලවී තිබුණු දේශපාලන දේහයකි.

ආණ්ඩුවේ එදිනෙද වැඩ කරන ගමන්ම, දේශපාලන හා පරිපාලන ආයතන පිරිසිදු කිරීමටත් පියවර ගැනීමටත් මගේ ආණ්ඩුවට සිදු විය. දූෂණයට යටවූ සහ අවුරුදු ගණනාවක් තුළ සිදුවූ දේශපාලන බියවැද්දීම් නිසා ස්වාධීන ලෙස සිතීමට හෝ ක්‍රියා කිරීමට නොහැකි ලෙස දුර්වලව තිබුණු පරිපාලන තන්ත්‍රයක් සිටියදී, මෙය පහසු කාර්යයක් නොවෙයි. බියවැද්දීම් සහ හිංසනය මගින් ආණ්ඩු කිරීම සඳහා පසුගිය අවුරුදු 17 තුළදී මතුවූ දේශපාලන ආයතන වල, ජනතාවගේ කැමැත්ත ප්‍රකාශයට පත්වීම් වෙතින් එන සංවරණ සහ තුලන ක්‍රමයන්ට කිසිම ඉඩක් තිබුණේ නැත. ඇත්තටම, ජනාධිපති ධූරයට හිමිවී තිබෙන අති මහත් ව්‍යවස්ථාමය බලතල පාවිච්චි කරමින්, පැරණි අධිකාරවාදී, හිතුවක්කාර පාලන තන්ත්‍රයට ආපසු යෑම අමාරු දෙයක් නොවෙයි. එහෙත් අපේ ආණ්ඩු පාලන ශෛලිය ඊට වඩා හාත්පසින්ම වෙනස් එකකි.

රට මුහුණදී තිබෙන බැරෑරුම් ප්‍රශ්න, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස විසඳීම සඳහා අවශ්‍ය ධෛර්යය අපට තිබේ. එය අපට ලැබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සහ මනා පාලනය සඳහා අප වෙත ඇති කැපවීම වෙතිනි. මේ අරමුණු ඉටුකිරීම වෙනුවෙන්, මගේ ආණ්ඩුව පසුගිය මාස 4 1/2ක කෙටි කාලය තුළදී පියවර රාශියක්ම ගෙන තිබේ.

## ප්‍රජාතන්ත්‍රවාදය නැවත ස්ථාපිත කිරීම

මගේ ආණ්ඩුව ඉටුකළ පළමුවන කාර්යය වූයේ අපේ ජනතාව භුක්ති විඳින නිදහසේ මූලික හරයන්ටම පහර වදින ලෙස කිසිදු චකිතයකින් හෝ බිය සැකකින් හෝ තොරව අයුතු ලෙස පාවිච්චි කළ හදිසි නීති බලතල ඉතා විශාල ප්‍රමාණයකින් ලිහිල් කිරීමයි. සුප්‍රසිද්ධ විද්වතෙකු කියා ඇති පරිදි, "සැමදා සුපරීක්ෂාවෙන් සිටීම නිදහස වෙනුවෙන් ගෙවන මිළයි". එසේ වුවත් පසුගිය කාලයේ දිගින් දිගටම වැඩිවූ හදිසි නීති රෙගුලාසි නිසා සිදුවූයේ, නිදහසට පසම්තුරු පරිසරයක් තුළ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් භුක්ති විඳින්නට තබා, ඒවාට අයිතිය කියා පැමටත් අවකාශයක් නැති වීමයි. ඉතා සුළු හේතු උඩ පවා නිතර පණවනු ලැබූ හදිසි නීති රෙගුලාසි නිසා සාමාන්‍ය නීතිය යටතේ පුරවැසියන්ට හිමිව තිබූ ආරක්ෂණයක් පවා අහෝසි වී තිබුණි.

අති විශේෂ ව්‍යාකූලතා සහ කැළඹිලි තිබෙද්දී ඒවා පාලනය කිරීමට හදිසි නීතිය අවශ්‍ය බව සැම ජාතිහුම පිළි ගනිති. එසේ වුවත්, ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් ආරක්ෂා කිරීම වැදගත් කොට සළකන ඕනෑම සමාජයක, සාමාන්‍ය නීතියෙන් සහ නෛතික ආයතන වලින් බැහැර වීම් සිදුවිය හැකියි. එහෙත් ඒවා සැළකිය යුත්තේ, කළාතුරකින් සිදුවන ව්‍යතිරේකයන් හැටියට මිස පමණි. එහෙත් ඛේදජනක දෙයනම්, මගේ ආණ්ඩුව වැඩ භාර ගන්නා විට අවුරුදු දහයක කාලයක් පුරාම ඉවක් බවක් නැතිව යොදාගෙන තිබුණු හදිසි අවස්ථා නීති, සාමාන්‍ය, දෛනික ජීවිතයේම අංගයක් ලෙස පිළිගැනීමට ජනතාවද පත්වී සිටීමයි. ආණ්ඩුවට විරෝධය පැමට ජනතාවට තිබූ හැකියාව මොට කර තිබුණු අතර, විරෝධතා හඬක් නැගුණේ කලාතුරකිනි. අසාධාරණයට එරෙහිව අප තුළ පැන නැගුණු කෝපය, එළදයී ලෙස ප්‍රකාශ

කිරීමට අප වෙත තිබූ අවකාශයද සිඳී ගොස් තිබුණි. ප්‍රජාතන්ත්‍රවාදී සම්ප්‍රදායයේ සරල අංගෝපාංග පවා ගරු කරන සමාජයකට මීට වඩා විපතක් සිදුවිය නොහැකිය.

වැඩ භාරගත දින දහයක් ඇතුළතදී, යුද්ධ තත්වය නිසා හදිසිනීතිය දිගටම පැවතිය යුතු ප්‍රදේශවල හැර දිවයිනේ අන් සියලු ප්‍රදේශ වලින් හදිසි නීතිය ඉවත් කිරීමට මගේ ආණ්ඩුව සමත් විය. ඒ මගින් අප කෙළේ හදිසි නීතිය යටතේ අති විශේෂ නීති පැනවීමට ජනාධිපතිවරයාට බලය පැවරීම වෙනුවට, පාර්ලිමේන්තුවේ නිසි විෂය පථයට වැටෙන නීති සම්පාදන බලතල යළි පාර්ලිමේන්තුවට ලබාදීමයි. මෙහි ප්‍රතිඵලයක් හැටියට කිසිදු බාධාවකින් හෝ බියකින් තොරව අදහස් ප්‍රකාශ කිරීමට හා නිදහස භුක්ති විඳීමට ඉඩ සැළසෙන වාතාවරණයක් යළි ගොඩ නැගීමට, මගේ ආණ්ඩුව සමත්වී ඇත.

පුවත්පත් කලාවේදීන්, වෘත්තිකයින්, වෘත්තීය සමිති නායකයින්, සරසවි සිසුන් පමණක් නොව පාසැල් දරුවන් පවා, මහ රෑ ඔවුන්ගේ නිවෙස් වලින් පැහැරගෙන ගොස්, ටයර් සෑයවල පුළුස්සා මරා දමනු ලැබූ යුගය දැන් අවසන් වී ඇත.

තම පවුල් වල ආදරණීය සාමාජිකයින්, යුද පිටියේ දී නොව අමු අමුවේ ම මරා දමනු ලැබීම නිසා, දහස් ගණනක පවුල් විඳින ශෝකය සහ වේදනාව ගැන මගේ ආණ්ඩුව තියුණු ලෙස සංවේදී බව මෙහිදී කියනු කැමැත්තෙමි. "යුද අවි ගැටෙද්දීත්, නීතියට ගොලු වන රැකිය නොහැකි ය" යන මූල ධර්මය මගේ ආණ්ඩුව මහත් භක්තියෙන් සළකයි. රාජ්‍යයේ ක්‍රියාවන්, ඉතාම දුෂ්කර අවස්ථාවලදී පවා නීතියට එකඟ විය යුතුය යන අදහස නිරන්තරයෙන්ම අවධාරණය කෙරෙන්නේ නැත්නම්, සිවිල් සමාජයේ, අවසාන විග්‍රහයේදී සමස්ත ශිෂ්ටාචාරයේම, පදනම් දෙදරා වැටීම අනිවාර්ය වෙනු ඇත.

අපේ රටේ පසුගිය කාල පරිච්ඡේදයේ දී සිදුවූ අතුරුදහන්වීම් ගැන සොයා බැලීමට පරීක්ෂණ කොමිෂන් සභා තුනක් මගේ ආණ්ඩුව විසින් පත් කරනු ලැබ ඇත. අපේ අරමුණ කිසිම

පුද්ගලයකු හෝ ආයතනයක් අපකීර්තියට හෝ නින්දාවට පත් කිරීම නොවේ. තම ආදරණීයයන්ට ඇත්තටම සිදුවූ ඉරණම නිසැකවම දැනගත්විට වේදනාව දරා ගැනීම පහසු වන බව අපි දනිමු. කොයි තරම් ඛේදජනක වුවත් සිදුවූ දේ පිළිබඳ හරි තොරතුරු දැනගත් විට එය වේදනාව සමනය කිරීමට හේතුවන ප්‍රතිකර්මයක් වැනිය. අතුරුදහන්වී මිය ගොස් ඇති අය සම්බන්ධ මරණ සහතික නිකුත් කිරීමෙන් ඒ සිදුවීම් ගැන නිසි ලේඛන ගත කිරීමක්ද කළ යුතුව තිබේ.

මගේ ආණ්ඩුව වැඩ භාරගත් අවස්ථාවේ දී කිසිදු අධිකරණ පරීක්ෂණයකට භාජනය නොවී නිදහස අහිමි වූ විශාල සංඛ්‍යාවක් සිර කඳවුරු වල රඳවා ගනු ලැබ සිටියහ. මේ පසුබිම තුළ අපේ රට දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද මහත් අපකීර්තියට හා විවේචනයට ලක් විය. ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාම ලත් විනිශ්චයකාර තුමෙකුගේ සභාපතිත්වයෙන් යුත් පරීක්ෂණ කමිටුවක් පත් කිරීම නිසා විරුද්ධව සාක්ෂි නැති රැඳවියන් විශාල ගණනක් නිදහස් කිරීමට අපට හැකි විය. අපරාධ චෝදනා සඳහා සාක්ෂි තිබෙන රැඳවියන් ගැන වහා නීති මගින් ක්‍රියා කරන ලෙස අදාල අංශ වලට උපදෙස් දී තිබේ.

ඒ සමගම, මැතිවරණ කාලය තුලදී හටගත් ප්‍රචණ්ඩ ක්‍රියා නිසා සිදු වූ මරණ පිළිබඳ තීරණාත්මක ගැටලුව ද අප හමුවේ තිබුණි. මෙවැනි ප්‍රචණ්ඩ ක්‍රියා නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ ජීවනාලිය වන මැතිවරණ ක්‍රියාවලිය දුර්වල කිරීමට හේතු වෙයි. මැතිවරණ සමයේ ඇතිවූ ප්‍රචණ්ඩ ක්‍රියාවලට ගොදුරුවූවන්ට වන්දි ගෙවීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර තුමකුගේ මෙහෙයවීම පිට පරීක්ෂණ ඒකකයක් පිහිටුවීමට මගේ ආණ්ඩුවෙන් ක්ෂණික පියවර ගැණින. එම කමිටුවේ වාර්තාව දැනටමත් ලැබී ඇති අතර, ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර දැන් ගැනෙමින් තිබේ.

ගරු මන්ත්‍රීවරුනි, මගේ ආණ්ඩුව ගත් මේ පියවරයන් පසුගිය අවුරුදු 17 තුළ සිටි ආණ්ඩුවේ ක්‍රියා කලාපයට හාත්පසින් වෙනස් වන්නක් බව මෙහිදී සඳහන් කිරීමට මා කැමතියි. මැතිවරණ

සමයේ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට ගොදුරු වූවන්ට වන්දි ගෙවනවා වෙනුවට ඔවුන් කෙළේ ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ පිළිබඳ සෑම මූලධර්මයක්ම හිතුමතේ උල්ලංඝණය කිරීමය. මැතිවරණ කොමසාරිස් තුමා ලියා ඇති වාර්තාව ද, දේශීය හා ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් සංවිධාන ඉදිරිපත් කර ඇති වාර්තා ද මෙයට සාක්ෂි දරයි. මහජන සහයෝගය නැති ආණ්ඩුවකට ජනතාවගේ කැමැත්තෙන් තොරව වංචනික ලෙස බලයේ සිටීමේ උප්පරවැට්ටි බවට මැතිවරණ පත්කර තිබුණු බව අපි අමතක නොකරමු.

"ඔම්බුඩ්ස්මන්වරයා" නැතහොත් "යුක්තිපති" යනුවෙන් හැඳින්වෙන පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ධූරය ශක්තිමත් කිරීමට ද මගේ ආණ්ඩුව අවශ්‍ය නීති පනවා තිබේ. නීති මාර්ගයෙන් අධිකරණය හරහා ගැටුම් විසඳ ගැනීමේ කල්ගතවන සාම්ප්‍රදායික ක්‍රමයට අලුත් විකල්පයක් තිබිය යුතු යැයි අපි විශ්වාස කරමු. අපේ වැනි රටක නෛතික ආයතන කෙරෙහි මහජනතාව තුළ ඇති විශ්වාසය සුරකීමට නම් ඉක්මන්, වියදම් අඩු, සරල සහ සංකීර්ණත්වයේ ගැටලු නැති විකල්ප ක්‍රියා දමයන් ආරාවුල් සහ ගැටළු විසඳීම සඳහා තිබීම අත්‍යවශ්‍යවේ.

අපේ රටේ සංස්කෘතික උරුමයන් හා දේශපාලන අගැයීම් පද්ධතීන් තුළ හොඳින් මුල් බැස ගෙන ඇති ඔම්බුඩ්ස්මන්වරයා එවැනි කදිම විකල්ප ක්‍රියාමාර්ගයකි. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඔම්බුඩ්ස් ධූරයක් ඇති කර තිබෙන නමුත් කණගාටුවට මෙන් එහි ඇති ක්‍රියා පටිපාටිමය දුෂ්කරතා නිසා එහි ප්‍රායෝගික ප්‍රතිඵල මහජනතාවට නිසි ලෙස ලැබී නැත.

ඔම්බුඩ්ස් ධූරය සම්බන්ධව දැනට තිබෙන අනවශ්‍ය සංකීර්ණතා නැති කොට හානි ලැබූ පුද්ගලයින්ට බාධාවකින් තොරව සහ සෘජුව යුක්තිපතිවරයාගෙන් සහාය ලබා ගැනීමට අවකාශ ලබා දීම සහතික කරන නීති පැනවීමට මගේ ආණ්ඩුව දැනටමත් පියවර ගෙන ගිබේ. මේ පියවරේ ප්‍රතිලාභ ජනතාවට ඉක්මණින් ලැබෙන බව අපේ විශ්වාසයයි.

## දූෂණය මුලිනුපුටා දැමීම

ගරු මන්ත්‍රීවරුනි, මගේ ආණ්ඩුව මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කළ මුල්ම නීති කෙටුම්පතේ අරමුණ වූයේ, අපේ මවුබිමේ මහජන ජීවිතයේ ගෞරවය හා කීර්තිය ආරක්ෂා කිරීම බව ඔබට මතක ඇත. පාර්ලිමේන්තුවෙන් ඒකමතිකව සම්මත වූ මේ නීතියෙන්, අල්ලස සහ දූෂණය පිළිබඳ ස්ථාවර කොමිෂන් සභාවක් පිහිටුවීමට, විධිවිධාන යෙදිණ. මේ නීතියේ ඇති ඉතාම කැපී පෙනෙන ලක්ෂණය නම් එම කොමිෂන් සභාව දේශපාලන බලපෑමෙන් සම්පූර්ණයෙන් ම නිදහස් වීම යි.

මෙය පෙර පැවති තත්ත්වයට හාත්පසින්ම වෙනස් වූවකි. එකල අල්ලස් කොමසාරිස් දෙපාර්තමේන්තුව කටයුතු කළේ අධිකරණ අමාත්‍යාංශය සහ අමාත්‍ය මණ්ඩලය යටතේය. කිසිදු බියකින් හෝ වාසි සිදු කිරීමකින් තොරව සහ හෘදය ශාක්ෂියට අනුව පමණක් තම නිල කාර්යයන් කළ එහි නිලධාරීන්ට සිදු වූයේ බලසම්පන්න දේශපාලනඥයින් ගේ කෝපයට සහ හිරිහැර වලට ලක්වීමට යි. එමෙන්ම, පරීක්ෂණ කොමිෂන් සභා පණත යටතෙත් ත්, විශේෂ ජනාධිපති කොමිෂන් සභා පණත යටතේ ත්, පත් කරනු ලැබූ කොමිෂන් සභා සාමාජික වරුන් බලගතු තැන්වල සිටි දේශපාලඥයින්ට විරුද්ධව තිබූ චෝදනා පරීක්ෂා කිරීම ආරම්භ කරද්දීම ඔවුන් දුටුවේ තම කොමිෂන් සභා අහෝසි වන බවයි.

පසුගිය ආණ්ඩුවේ කටයුතු වල කැපී පෙනෙන ලක්ෂණයක් වූ පාර්ලිමේන්තු වරප්‍රසාද හිතුමතේ අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම වැලැක්වීමට මගේ ආණ්ඩුව දැනටමත් පියවර ගෙන ඇත. පසුගිය ආණ්ඩුවේ ඉහළ පෙලේ ඇමති වරුන්ට විරුද්ධව තිබුණ අල්ලස් චෝදනා පරීක්ෂා කිරීමට අවසර දීම, කථානායක තුමා පැහැර හැර තිබුණි. එබැවින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එරෙහිව ඇති අල්ලස් චෝදනා විභාග කිරීමට කථානායක තුමාගේ අනුමැතිය අවශ්‍යය යන කොන්දේසිය අහෝසි කිරීමට අපි ක්ෂණික පියවර ගත්තෙ මු. මේ පියවරේ සෘජු ප්‍රතිඵලය නම්, රාජ්‍ය බලය අයුතු ලෙස පාවිච්චි කිරීම පිළිබඳව පරීක්ෂණය ට ලක් වීමෙන් හෝ දඬුවම් ලැබීමෙන් වැළැක්කී සිටීමේ ආවරණයක් ලෙස, රටේ

උත්තරීතර ව්‍යවස්ථාදායක ආයතනය යොදා ගැනීමට තව දුරටත් නොහැකි වීම යි. මේ මගින් අප පැහැදිලිවම, වචනයෙන් නොව ක්‍රියාවෙන්ම, ඔප්පු කර ඇත්තේ අපේ රටේ දේශපාලන ජීවිතය විවෘත භාවයෙන් සහ වගඋත්තර කීමෙන් යුතුව තිබිය යුතු බවයි.

මගේ ආණ්ඩුවත්, මාත්, ඉතා උතුම් සහ අනුල්ලංඝණීය කොට සළකන වටිනාකම් පද්ධතියක් තිබේ. අප දේශපාලන ජීවිතයේ මුදුන් මල් කඩ ලෙස සලකන මේ වටිනාකම් පද්ධතියෙන් එක ක් වන්නේ, දේශපාලන ධූරය දරණ කාලය තුළ සිදු කරන සියලුම කටයුතු, එක හෙළාම සෘජුව හා අවංකව සිදු විය යුතු ය යන්නයි. මගේ දෙමව්පියන් සහ මා අවුරුදු 67ක දීර්ඝ කාලයක් තිස්සේ අපේ රටේ දේශපාලන ජීවිතයට සම්බන්ධ වී ඇත. අප කිසිවෙකුට වත්, අනිසි හෝ නීති විරෝධී මාර්ග වලින් ධනය රැස්කිරිම පිළිබඳ චෝදනාවක අංශු මාත්‍රයක් හෝ එල්ල වී නැති බව මම නිර්භයවම ප්‍රකාශ කරමි. ඇත්තටම සිදුවී තිබෙන්නේ, රටට සේවය කිරිම නිසා මගේ පවුලට ධනය සහ දේපොළ අහිමිවීමයි. මෙය මට ආඩම්බර විය හැකි, මහජන සේවයට අවංකව කැපවීමේ සම්ප්‍රදායකි.

මගේ ආණ්ඩුව ශ්‍රී ලංකාවේ මහජන ජීවිතය පිරිසිදු කිරීමේ කාර්යයට උරදී සිටින්නේ මේ උදාර සම්ප්‍රදයට අනුවය. අප මේ වගකීම ඉටු කරන්නේ කිසිවෙකු පිළිබඳ වෛරයකින් හෝ ඊර්ෂ්‍යාවකින් හෝ නොවේ. අපේ දැඩි විශ්වාසය නම්, අප රට දූෂණයෙන් සහ වංචාවෙන් නිදහස් කිරීමට නිරන්තර හා තිරසාර උත්සාහයක් නොගත හොත්, අපේ සමාජ ආයතන ගරා වැටීම අනිවාර්ය වන බවයි. මහා පරිමාණ දූෂණය නිසා, වටිනා ආර්ථික සම්පත් කොල්ල කෑමට අමතරව සිදුවී තිබෙන්නේ අපේ රටේ ජනතාව, විශේෂයෙන් තරුණ පරපුර, සමාජ හා දේශපාලන ආයතන පිළිබඳ මහත් කළ කිරීමකට පත් වීමයි.

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ

මෙහිදී සඳහන් කළ යුතු තවත් වැදගත් දෙයක් නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා අප දැනටමත් ගෙන ඇති පියවරයි.

දැනට තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අහෝසිකර අපේ ජනතාවගේ අපේක්ෂාවන් හා බලාපොරොත්තු සාධනය කර ගැනීමට වඩාත් අවකාශ ලැබෙන නව ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ඒ වෙනුවට ඉදිරිපත් කිරීමට ජනතාව මගේ ආණ්ඩුවට අති විශාල ජනවරමක් දී ඇත.

1978 ව්‍යවස්ථාවේ ව්‍යුහයන් බෙහොමයක් ම සකස් වී තිබෙන්නේ බලය ඒකරාශි වීම අරමුණු කරගෙනය. එම ක්‍රමය කොතරම් දුරට එක් පුද්ගලයෙකුට බලය ලබා දෙන්නේ ද යත් එය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක නිදහසේ පහත් සීළුව නොතිවා පවත්වා ගැනීමට අත්‍යාවශ්‍යවන සියලුම සංවරණ හා තුලන ක්‍රමයන්ට පටහැනිව යයි. පසුගිය කාලය තුළ විධායක ජනාධිපති ධූරය වෙත ඒකරාශි වී තිබුණු අසීමිත බලය පාවිච්චි කළ ආකාරය කෙබඳුදැයි කිවහොත් දේශපාලන ආයතනයක් හැටියට එහි කිසිදු සාධනීය පැත්තක් ද දැකිය නොහැකි විය. ලංකාවේ දැනට පවත්නා ආණ්ඩුක්‍රම ව්‍යුහයේ කේන්ද්‍රය වන විධායක ජනාධිපති ධූරය අහෝසි කොට පාර්ලිමේන්තු හා කැබිනට් ආණ්ඩු ක්‍රමයක් ඒ වෙනුවට හඳුන්වා දීමට මගේ ආණ්ඩුව කැපවී සිටී.

ජනතාව ඡන්දයෙන් තෝරා පත් කර ගත් නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව රාජ්‍ය බලයේ ප්‍රධානතම ආයතනය වනු ඇත. එසේ නමුත් පාර්ලිමේන්තුවේ පවා ප්‍රතිසංස්කරණ අවශ්‍යයයි. පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන් තෝරා ගැනීමට දැනට පවත්නා මැතිවරණ ක්‍රමය හේතු රාශියක් නිසාම අසතුටුදායක එකක් වී තිබේ. මෙය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියටම යම් තරමක හානියක් සිදු කරන්නකි. ඊට අමතරව මනාප ඡන්ද ක්‍රමය නිසා ආරවුල් සහ පසමිතුරුකම් පෙර නොවූ විරූ ලෙස මතුවී තිබෙන අතර ඒවා බොහෝ විට දේශපාලන පක්ෂ ඇතුලතම ප්‍රචණ්ඩ ක්‍රියාවලට ද තුඩු දී තිබේ.

අපේ රටේ මේ වන විට හටගෙන තිබෙන තියුණු දේශපාලන බෙදීම් වලින් මතුවී ඇති අයහපත් ප්‍රතිඵල වැළැක්වීමට ව්‍යවස්ථා මණ්ඩලයක් පිහිටුවීමට මගේ ආණ්ඩුව අදහස් කරගෙන සිටියි. ව්‍යවස්ථා මණ්ඩලයේ සංයුතිය පාර්ලිමේන්තුවේ නියෝජනය ලබන

දේශපාලන පක්ෂ අතර බල තුලනය නියෝජනය කරනු ඇත. ඉතා වැදගත් කොමිෂන් සභාවල සාමාජිකයන් නම් කිරීමේ වගකීම මෙම ආයතනයට භාරවෙනු ඇත.

මගේ ආණ්ඩුවෙන් ඉදිරිපත් කෙරෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යෝජනා වලිය මගින් ව්‍යවස්ථාවේ ගැබ් වී තිබෙන මූලික අයිතිවාසිකම් ශක්තිමත් කිරීමට විශේෂ අවධානය යොමු වේ. එමෙන් ම පාර්ලිමේන්තු පණත් පිළිබඳ අධිකරණ විමර්ශනය, රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සහ පාර්ලිමේන්තු උපදේශක සභා ක්‍රමය ශක්ති සම්පන්න කිරීම යන අංග ද එයට ඇතුලත් වේ.

ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ ව ඇති සෑම අංශයක් ගැනම දේශපාලන පක්ෂ අතර අදහස් හුවමාරු කර ගැනීමේ වේදිකාව වනු ඇත්තේ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා වූ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවයි. මේ වර්ෂයේ ජූලි 15 දින වන විට මේ කාරක සභාව මිත්‍රත්වයේ සහ සහයෝගයේ ජීව ගුණයෙන් යුතුව තම කාර්යය සමාප්ත කරනු ඇත යනු මගේ ආණ්ඩුවේ විශ්වාසයයි.

සක්‍රිය, නිර්භය සහ මනා ලෙස සකස්වූ මහජන මතයක් පැවැතීම ජාතික ප්‍රශ්න විසඳීම සඳහා හේතු වන මූලික කොන්දේසියක් වේ යැයි මගේ ආණ්ඩුව තරයේම පිළිගනියි. මෙහි අදහස නම් ශක්තිමත් හා ස්වාධීන ජන මාධ්‍යයක් පැවැතීමේ අවශ්‍යතාවයයි. අපේ රටේ ජනමාධ්‍යය විවෘත සහ වක්‍ර සීමාවන්ට සහ බලපෑම් වලට යටත්ව පැවැතුණු කල් හොඳටම වැඩිය මහජනයාට තොරතුරු ලබාදීම සහ මහජන උනන්දුව ඇති කරුණු ගැන බාධාවන්ගෙන් තොරව අදහස් දැක්වීම මගින් තම කාර්යයන් නිසි ලෙස කිරීමට ජනමාධ්‍යයන්ට ඉඩ ලබාදෙන තත්වයන් නිර්මාණය කිරීම අපේ නොසැලෙන අපේක්ෂාවයි. ජනමාධ්‍යයට සම්බන්ධ පවත්නා නීති රීති සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ කටයුතු දැනටමත් අරඹා ඇත.

එක්සත් පුවත් පත් සමාගමේ අයිතිය පුළුල් කිරීම සම්බන්ධවත් ලංකාවේ පුවත් පත් සහ විද්‍යුත් මාධ්‍ය වල අනාගතය පිළිබඳ

කරුණු ගැන පොදුවේත් සොයා බලා වාර්තා කිරීමට කමිටු කිහිපයක්ම දැනටමත් පත් කොට ඇත.

## ජනවාර්ගික ප්‍රශ්නය

මෙහිදී විශේෂයෙන් ම සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ ජනවාර්ගික ප්‍රශ්නය සහ උතුරු නැගෙනහිර පළාත්වල දැනට පවත්නා යුද්ධයයි.

මගේ ආණ්ඩුව ඡන්දයෙන් තේරී පත්වූයේ රටේ සාමය ඇති කිරීමට තුඩු දෙන පියවරයන් ගන්නා බවට කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් මතය. පසුගිය අවුරුද්දේ පැවැති සෑම මැතිවරණයකින්ම නිසැකයෙන්ම ප්‍රත්‍යක්ෂ වූයේ මුළු රටම සාමය පිළිබඳ අවංක බලාපොරොත්තුවකින් සිටින බවයි. ජීවිත සහ දේපොළ හානිය ගැන බලන විට යුද්ධයේ වියදම ගණනය කළ නොහැකි තරම්ය.

එක්සත් ජාතික පක්ෂය ගෙන ගිය පටු වර්ගවාදී ප්‍රචාර මැද්දේ ජනාධිපතිවරණයේ දී අප ලැබූ විශාල ජයග්‍රහණයේ පරිමාවෙන් සාක්ෂි දරන්නේ සාම අපේක්ෂාව සම්බන්ධයෙන් අපේ ජනතාව තුළ ඇති නොසැලෙන විශ්වාසය සහ බුද්ධි මහිමයයි. නිදහස් ලංකාවේ ඉතිහාසයේ ප්‍රථම වරට අපේ රටේ සෑම දිග් භාගයකම සිටින සෑම ජන කොටසක්ම වාර්ගික සහයෝගිතාව හා සාමය වෙනුවෙන් පැහැදිලි හඬකින් කථා කිරීම සතුට මිශ්‍ර පුදුමය දනවනනත්කි.

අපමණ බාධා මැද්දේ වුවත් සාමය යථාර්ථයක් වනු දකීමේ අරමුණින් ඉදිරියට යෑම සඳහා මගේ ආණ්ඩුවට ශක්තිය හා ධෛර්යය ලබාදෙන අපේ සියලු ජනතාවගේ අධිෂ්ඨානයට මගේ ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අපේ ආණ්ඩුව ජනවාර්ගික ප්‍රශ්නයට සාමකාමී විසඳුමක් සැපයීම සඳහා කැපවී සිටී. සෑම ජන කොටසකටම ආරක්ෂා සහිතව ජීවත්විය හැකි, මනුෂ්‍යත්වය අගයන සෑම පුරවැසියකුටම එක සමානව සලකන ශ්‍රී ලංකාවක් බිහි කිරීමේ ඉදිරි දර්ශනයක් අපට තිබේ. තමන්ගේ අනන්‍යතාවය ප්‍රකාශ කිරීමටත් ජාතික, ප්‍රාදේශීක, හෝ ග්‍රාමීය මට්ටමෙන් ජාතික ජීවිතයට එක සමානව සම්බන්ධවී දායක විය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

හැකි තත්වයක් නිර්මාණය කිරීමටත් නිදහස, සෑම ජන කොටසකටම තිබිය යුතු යැයි අපි විශ්වාස කරමු. රටේ ඇති අභ්‍යන්තර අසහනයට සහ ගැටුම්වලට අප සතු ප්‍රවේශයට මග පෙන්වන්නේ අවිහිංසාව සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අප තුළ ඇති කැප වීමයි. මර්දනය ප්‍රශ්න විසඳීමට ඇති ලෙහෙසි සහ කෙටිම මගක් වුවත්, දීර්ඝ කාලීන වශයෙන් එයින් කෙරෙන්නේ ජාතික ජීවිතයේ පදනම විනාශ කිරීමයි. ජනවාර්ගික ගැටුමට සාමකාමී විසඳුමක් සැපයීමට ආණ්ඩුව වෙත ඇති කැප කිරීමේ හදවතෙහිම තිබෙන්නේ සංවාදය උනන්දු කරවන අවිශ්වාසය තුනී කරන, සම්මුතියට මග පාදන, ඉවසීමෙන් යුතු ප්‍රවේශම්කාරී සහ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයකි.

රාජ්‍ය භාෂා කොමිෂන් සභාව අලුතෙන් සකස් කර ඇති අතර සිංහල හා දෙමළ රාජ්‍ය භාෂා වශයෙනුත් ඉංග්‍රීසි භාෂාව පොදු භාෂාවක් වශයෙනුත් සැලකෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට එයට බලය පවරා ඇත. ලංකාවේ සෑම කෙනෙකුටම තමන් කැමති රාජ්‍ය භාෂාවකින් රජය සමග තම කටයුතු කිරීමේ පහසුකම අපි සහතික කරන්නෙමු.

ආණ්ඩුව පත්වී දින කිහිපයක් ඇතුළතදීම සාම ක්‍රියාවලිය දියත් කිරීමට අප පියවර ගත්තේ ඉහතින් දැක්වූ ජීව ගුණය තුළය. සාමය ඇති කිරීම සඳහා එල්. ටී. ටී. ඊ. සංවිධානය සමග සාකච්ඡා කරනු පිණිස ප්‍රවේශමෙන් සකස් කළ සාකච්ඡා ක්‍රියාවලියක් අප දියත් කර ඇත. ජනවාරි 08 ද සිට, එනම් අදින් දින දෙකකින් ක්‍රියාත්මක වීම පටන් ගන්නා පරිදි එදිරිවාදිකම් අත්හිටුවීම සඳහා එකඟතාවයකට එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග සාකච්ඡා කොට එළඹුණු බව මේ ගරු සභාවට මා දන්වා සිටින්නේ සතුටිනි. මා අයත්වන දේශපාලන පක්ෂයේ ආරම්භක නායකයා වූ මගේ පියාගේ 96 වන උපන් දිනයේ දී ආරම්භ වන මේ එදිරිවාදිකම් අත්හිටුවීමේ ක්‍රියාදමය, සාමය සාධාරණත්වය රජ කරන සියලු ජන කොටස් අතර ඇති සහෝදරත්වයේ සහ සහ ජීවනයේ හර පද්ධතීන්ගෙන් ප්‍රබුද්ධ වූ නව යුගයක ආරම්භය වනු ඇතැයි අපි ප්‍රාර්ථනා කරමු.

ජනවාර්ගික ප්‍රශ්නයට සහ සන්නද්ධ ගැටුමට පාදකවී ඇති මූලික කරුණු වලට සිත් යොමු කිරීම සඳහා වූ සාම සාකච්ඡා වලට මෙම එදිරිවාදිකම් අත්හිටුවීම ආරම්භයකැයි අපේ ආණ්ඩුව සිතන බව මා මෙහිදී අවධාරණය කළ යුතුය. බලය විමධ්‍යගත කිරීම පිළිබඳ යෝජනා වලියක් අපි ලඟදීම එල්. ටී. ටී. ඊ සංවිධානය වෙත ඉදිරිපත් කරන්නෙමු. මෙය, සාකච්ඡා මගින් එළඹෙන විසඳුමක පදනම වනු ඇත. කෙසේ වුවත් අප අපේක්ෂා කරන්නේ කෙසේ හෝ සාමය ලබා ගැනීම නොව ගෞරව සම්පන්න සාමයක් ඇති කිරීම බව මෙහිදී අවධාරණය කිරීමට මා කැමතිය. බහුතර ජන කොට්ඨාශයේ අයිතීන් ආරක්ෂා කෙරෙන ගමන්ම අන් සෑම වාර්ගික හා සංස්කෘතික කණ්ඩායමකම අභිමථාර්තයන් සමග පැහෙන පරිදි සෑම පාර්ශවයකම ගරුත්වය සහ ආත්මාභිමානය යෝජිත විසඳුම් මගින් ආරක්ෂා කෙරෙනු ඇත. සාමය නැමති මහාර්ඝ අරමුණ මුදුන්පත් කර ගැනීමට අප යන මේ ගමනේ ආරම්භක පියවරක් තැබීමේ දී සිංහල, දෙමළ, මුස්ලිම් යනාදී ශ්‍රී ලංකාවේ සෑම ජන ප්‍රජාවකගේම හොඳ හිත සහ ආශිර්වාදය ලැබී තිබීම ගැන මම මහත් සොම්නසටත්,ධෛර්යටත් පත්වී සිටිමි.

## ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය

මා කලින් ප්‍රකාශ කළ පරිදි, මේ රටේ මහජනතාව අපට රජය කරවීමේ වගකීම භාරදුන්නේ ඔවුන්ගේ නිදහස නැවත ලබාගන්නටත්, අවංක හා කාර්යක්ෂම රාජ්‍ය පාලනයක් නැවත ස්ථාපිත කර ගැනීමේ අයිතිය සාක්ෂාත් කරගන්නටත් පමණක්ම නොවේ. සෑම දෙනාටම සාධාරණව හා එකසේ සළකන සහ ශක්තිමත් ආර්ථික හා මූල්‍යමය රාමුවක් තුළ ගොඩ නැගෙන ශීඝ්‍ර සහ තිරසාර ආරථික වර්ධනයක යුගයක් ඇරඹීමට ද ඔවුහු අපේක්ෂා කළහ.

අපට කලින් රට කරවූ පාලකයින් ඉතා සාවද්‍ය මූල්‍ය හා ආරථික පාලනය පිළිබඳ දායාදයක් අපට තබාගොස් තිබෙන බව මා සඳහන් නොකළොත් එය මහජනතාව වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකමක් පැහැර හැරියා වෙයි. මේ නිසා අයවැය මත පැටවී තිබෙන බර දරන්නට බැරි තරම් විශාල එකක් බව කිව යුතුය. ඒවායේ බැරෑරුම් අහිතකර ප්‍රතිඵල තවත් ඉදිරියටත් විඳින්නට සිදුවනු ඇත.

1994 සඳහා ඇස්තමේන්තු කර තිබුණු රුපියල් බිලියන 58 ක් වන අති විශාල අයවැය පරතරය අප පාලන කටයුතු භාරගන්නා විට රුපියල් බිලියන 76.3 දක්වා වැඩිවී තිබුණි. මේ නිසා අපේම වූ අලුත් ආර්ථික පියවරයන් ගැනීමට පෙර අපට සිදුවූයේ බිලියන 18කින් වැඩිවූ අයවැය පරතරය පියවීමට මං සෙවීමටයි.

අයවැය ලේඛණයේ විදේශීය මුදල් සහභාගය විශාල වශයෙන් අඩුවී තිබිණ. එක්සත් ජාතික පක්ෂ රජයේ අවසන් වර්ෂය තුළ ලෝක බැංකුවෙනුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙනුත්, ආසියා සංවර්ධන බැංකුවෙනුත්, අරමුදල් සැපයීම අත්හිටුවා තිබිණ. මේ පියවර ගෙන තිබුණේ එක්සත් ජාතික පක්ෂ රජයේ ප්‍රතිපත්තිවල පැවැති බරපතල දෝෂ නිසාත්, රජයේ පැවැති දූෂණයන් නිසාත් ය. එයාර් බස් ගනුදෙනුව මෙන්ම බිම දුවන බස් ගනුදෙනු නිසාත් විශේෂයෙන් ම ජාත්‍යන්තර මූල්‍ය සම්පාදන සංවිධාන පසුගිය ආණ්ඩුව ගැන බලවත් කළකිරීමකට පත්ව සිටියහ. එමෙන්ම, මිනිස් අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම, උතුරු-නැගෙනහිර යුද්ධය විසඳීමට අපොහොසත්වීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය යන මේවා නිසා පැරිස් ආධාර කණ්ඩායම වැනි ද්වි-පාක්ෂික ආධාරකරුවන්ද තම ආධාර කපා හැර තිබුණි.

කලින් පැවැති රජය "පෞද්ගලිකකරණයේ" නමින් සිදුකර තිබෙන දෙය ජාතියටම අයත් අගනා වත්කම් මහ දවාලේම අමු අමුවේ සොරකම් කර ගැනීමකට බෙහෙවින්ම සමානය. බොහෝ අවස්ථාවල කොන්ත්‍රාත්තු ප්‍රදනය කිරීමේ දී සියළුම පිළිගත් සම්මතයන් හා කාර්ය පරිපාටීන් උල්ලංඝනය කර තිබේ. වතු වැවිලි හැරුණුවිට, පෞද්ගලිකකරණය කළ ව්‍යාපාර 43 ක් පමණ වන සංඛ්‍යාවෙන් අති විශාල ප්‍රමාණයක දී රජයේ මුදල් බරපතල ලෙස වංචා කර තිබේ.

පෞද්ගලිකකරණ ප්‍රතිපත්තිය සාමාන්‍යයෙන් අනුගමනය කළ යුත්තේ, රජයේ අයිතියෙන් ඉවත් වූ එම ආයතන වල නිෂ්පාදන ධාරිතාව හා රැකියා අවස්ථා ප්‍රමාණය වැඩි කිරීමේ අරමුණ ඇතිවය. පසුගිය රජය යටතේ පෞද්ගලිකකරණය කළ රාජ්‍ය ව්‍යාපාර කිසිවකින් හෝ එම අරමුණ ඉටුවී තිබෙන බවක් නොපෙනේ.

මෙම ව්‍යාපාරවල නියම වටිනාකම ඉතා බරපතල ලෙස අඩුවෙන් ඇස්තමේන්තු කර දක්වා තිබේ. තුනෙන් දෙපංගුවක් (2/3) තරමින් නැත්නම්, ඇතැම්විට හතරෙන් තුන් පංගුවක් (3/4) තරමින් ම ඒවායේ නියම වටිනාකම අඩුවෙන් දක්වා ඇත. ඒවා විකුණා

තිබෙන්නේත්, ගැණුම්කරුගෙන් නියම කරගත් ව්‍යාපාරයේ මිළෙන් ඉතා කුඩා ප්‍රමාණයක් ලබාගෙනයි. මිළෙහි ඉතිරි කොටස රජයේ බැංකු වලින්, නැත්නම් රජයේ භාණ්ඩාගාරයෙන් ණය මුදල් වශයෙන් ඔවුන්ට ලබාදී ඇත.

මහජන දේපල මේ ආකාරයෙන් එළිපිටම පැහැර ගැනීමක්, මංකොල්ලකෑමක් මේ මුළු මහත් ලෝකයේ වෙනත් කවර රටකවත් සිදුවී නැත. අද මෙම ව්‍යාපාර වලින් විශාල සංඛ්‍යාවක් බංකොලොත් වී ඇත. ඒවායේ සේවකයින්ට වැටුප් ගෙවීමට සිදුවී තිබෙන්නේ රජයේ භාණ්ඩාගාරයටයි. කෙටියෙන් කියනවා නම්, මෙම පෞද්ගලිකකරණය කළ ව්‍යාපාර වලින් රජයට කිසිත් ලාභයක් ලැබී නැත. ඒ වෙනුවට මෙම ඊනියා පෞද්ගලිකකරණය කළ ව්‍යාපාර වලින් රජයට දිගින් දිගටම පාඩු විඳින්නට සිදුවී තිබේ. ඒවාට හැකිවී තිබෙන්නේ පසුගිය රජයේ ඇතැම් ලොකු ලොකු පුද්ගලයින්ගේ ධනය තර කර දීමට පමණි.

මේවා ඉකුත් රජය අපට ගෙවීමට ඉතිරිකර තබා ගොස් තිබෙන බිල්පත්ය. එසේම ඔවුන්ගේ මෙම අසාධාරණ පාපකර්ම වලට වන්දි ගෙවන්නට සිදුවී ඇත්තේ අපටයි. රජයේ මුදල් තත්ත්වය මෙබඳු පිරිහී ගිය තත්ත්වයක පවතින නිසා අපගේ සුභසාධක හා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ දී අපට ඉතාමත් බුද්ධිමත්ව හා විචක්ෂණව ක්‍රියා කිරීමට සිදුවී තිබේ. එසේ නොකළහොත් උද්ධමනය නමැති ගින්නට පිදුරු දැමීමක් සිදුවෙනවා ඇති. එහි ප්‍රතිඵලය ලෙසට බඩු මිළ බොහෝ සෙයින් වැඩිවී අපේ විදේශ වත්කම් මත අති විශාල බරක් පැටවෙනවා ඇත. එමෙන්ම භාණ්ඩ මිළ අධික ලෙස වැඩිවීම නිසා සුභසාධක වැඩසටහන් කප්පාදු කිරීමට සිදුවීමෙන් දිළිඳු ජනයාට කරදර පැමිණෙනවා ද ඇත. එබඳු තත්ත්වයක් යටතේ ජීවන වියදම දැරිය නොහැකි තත්ත්වයෙන් වැඩිවීමට ඉඩ තිබේ. තවද, අපේ විදේශීය සම්පත් එදිනෙදා අවශ්‍යතාවයන් සඳහා අනුක්‍රමයෙන් වියදම් කිරීමටත් ලෝකයාගේ අනුකම්පාව මත යැපීමටත් අපට සිදුවෙනු ඇත. වගකීමේ හැඟීමෙන් යුත් රජයක් හැටියට ඉකුත් රජය විසින් ගෙන ඇති මෙම වගවිභාගයක් නැති අප්‍රවේශම්කාරී මග ගන්නට

අපට හැකියාවක් නැත. එම නිසා අපගේ සංවර්ධන හා ප්‍රභසාධන වැඩසටහන් ක්‍රමානුකූලව ඇරඹීමට පෙර අපගේ මුදල් තත්ත්වය ස්ථාවර තත්ත්වයට පැමිණවීමට පියවර ගැනීම හැර අපට ගතහැකි අන් මගක් නැත. ඉකුත් රජය මුදල් පරිහරණය කිරීමේදී කෙතරම් නාස්තිකාර අන්දමට ක්‍රියාකොට තිබේද යත්, අපට මුදල් දුෂ්කරතා මගහරවා ගැනීමට යටත් පිරිසෙයින් තවත් දෙවර්ෂයක් වත් ගතවනු ඇත.

මගේ ආණ්ඩුවේ පළමුවන ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනය 1994 සැප්තැම්බර් මස 13 වනදා ප්‍රකාශයට පත්කරනු ලැබීය. ඊට පසුව එම ප්‍රකාශනය පාර්ලිමේන්තුව හමුවේ තබනු ලැබිණ. එම ප්‍රතිපත්තිවලට අප තුළ ඇති කැපවීම නැවතත් සහතික කර ප්‍රකාශ කරන අතර, එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරගෙන යෑමට අපි අපේක්ෂා කරන්නෙමු. පසුගිය සැප්තැම්බර් මාසයේ සිට ස්ථිරසාර සාර්ව ආර්ථික හා මූල්‍යමය සංවර්ධන රාමුවක් ගොඩනැගීම අතින් රජය ප්‍රගතියක් ලබා තිබේ. පෞද්ගලික අංශය ආර්ථික සංවර්ධන ඇතිකිරීමේ ප්‍රධාන බලවේගය බවට පත්වන වෙළඳපොලට හිතකර ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට පූර්ව අවශ්‍යතාව වන්නේ මෙයයි. උද්ධමනය අඩුකිරීම, ශීඝ්‍ර ආර්ථික වර්ධනයක් කරා යාම, ඵලදායි රැකියා අවස්ථා ඇතිකිරීම, සංවර්ධනයේ ප්‍රතිඵල සාධාරණව බෙදී යන්නට සැලැස්වීම යන මේ අරමුණු වලටත් එය යෝග්‍ය වේ. මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා රජය අනුගමනය කරන සංවර්ධන උපාය මාර්ගය එකිනෙකට උපකාරී වන – එකිනෙකට ශක්තිය ලබාදෙන – සාධක අටකින් සමන්විත වේ.

එයින් පළමුවැන්න මෙයයි. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් උද්ධමනකාරී ණය ලබාගැනීමේ ප්‍රතිපත්තියට නොබැස ආදායම් පරතරය දැරිය හැකි මට්ටමට පවත්වා ගැනීමෙන් අපගේ මුදල් තත්ත්වය නිරවුල් සහ ස්ථාවර භාවයකට පත්කර ගැනීමට අප තුළ තිබෙන ස්ථිරසාර බලාපොරොත්තුව රජය නැවතත් ප්‍රකාශ කර සිටී. වර්ෂ 1993 පැවැති දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8ක් වූ සමස්ත මූල්‍ය පරතරය 1994දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10ක් පමණ ප්‍රමාණයට වැඩිවිය. මෙසේ වීමට ප්‍රධාන හේතුව වූයේ පාර්ලිමේන්තු මැතිවරණයට පෙර ඉකුත් රජය මැයි

1 වැනි දින කිසිත් වග විභාගයක් නැතිව ප්‍රකාශයට පත් කළ ප්‍රදනයන්ය. මීට වෙනස්ව අපගේ රජය වර්ෂ 1995 සඳහා වන මූල්‍ය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 8 දක්වා අඩු කිරීමට සෑම ප්‍රයත්නයක් ම ගනු ඇත. ඉදිරි අවුරුදු දෙකේදී පරතරය තවත් අඩු කිරීම එහි අරමුණයි. ඒ එක්කම රජය විසින් ප්‍රවර්තන ගිනුමේ අතිරික්තයක් ද ඇතිකොට ගැනීමට පියවර ගනිමු. එහි තේරුම නම් ආණ්ඩුවේ එදිනෙදා වියදම් පියවීම් ණය ගැනීම් මගින් නොකෙරෙන බවයි. ඊළඟ අවුරුදු කිහිපය තුළදී වඩාත් විශාල අතිරික්තයක් ඇති කිරීමට අප කටයුතු කරන අතර, එය ආයෝජනය සඳහා යොදා ගනු ඇත.

දෙවැනි සාධකය මෙයයි. වර්ෂ 2000 වන්නට කලින්ම මූල්‍ය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 3 සිට 4 දක්වා වන ප්‍රමාණයකට අඩු කිරීමේ මධ්‍යම කාල ඉලක්කයට ලඟාවීමට හැකිවන අයුරු ආදායම් පරතරය 1996 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.5 කට වැඩි නොවන ප්‍රමාණයක් දක්වාත් වර්ෂ 1997 වනවිට සියයට 5ක් දක්වාත් අඩු කිරීමට අපගේ රජය කැපවී සිටී. මෙයින් අදහස් කරන්නේ රජය ලබා ගන්නා ණය ප්‍රමාණය අඩුවීම නිසා රජයේ ජාතික ඉතිරි කිරීම් වලින් සැළකිය යුතු ප්‍රමාණයක් පෞද්ගලික අංශයට මුදාලීමට රජයට හැකිවන බවය. මෙහි ප්‍රතිඵල වශයෙන් පොලී අනුපාතයන් අඩු කිරීමටත් ආයෝජනයන්ට දිරි දීමටත්, උද්ධමනය සමනය කිරීමටත් හැකිවේ. පෞද්ගලික අංශයේ වර්ධනයට ප්‍රධාන බාධකයක්වී තිබෙන්නේ ඉහළ පොලී අනුපාතයන්ය.

නිරන්තරයෙන්ම ඉහල මට්ටමක පැවැතුණු උද්ධමනය අපේ රටේ ආර්ථික වර්ධනයට බලවත් පහරක් විය. 1994 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය උද්ධමන ප්‍රමාණය සියයට 11.4 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් අප හැම දෙනාම, විශේෂයෙන් දුගී ජනතාව, ඉහළ ජීවන වියදම් බරින් මිරිකුණෙමු. උද්ධමනය නිසා පොළී අනුපාත ඉහළ ගිය අතර ආයෝජන මන්දෝත්සාහී කෙරිණ. ඒ නිසාම ආර්ථික වෘද්ධිය ද මොටවී ඉහළ සේවා වියුක්ති තත්ත්වයක් ඇති විය. ඉහළ උද්ධමන වේගයක්

තිබුවිට එයින් පෙනෙන්නේ ආර්ථික කළමනාකරණය දුර්වල බවයි. එය ආයෝජක විශ්වාසය පළුදු වීමට ද තුඩුදුණේ. 1994 දෙසැම්බර් මාසය වන විට වාර්ෂික උද්ධමනය සියයට 8.4 දක්වා අඩු කිරීමට අපට හැකි විය. වාර්ෂික උද්ධමන අනුපාතය නවත් වසර කිහිපයකින් සියයට 5 නොඉක්මවන ප්‍රමාණයක් දක්වා අඩු කිරීම අපගේ මධ්‍යම කාලීන අධිෂ්ඨානයයි. ආදායම් පරතරය පිළිගත හැකි සතුටුදායක මට්ටම් දක්වා පහත හෙළනු ලැබූවිට ශ්‍රී ලංකා රුපියලේ පූර්ණ පරිවර්ත්‍ය තත්ත්වය දිනාගැනීම සඳහා ඉදිරියට යා හැකි තත්ත්වයන් උදාවනු ඇත.

තුන්වන සාධකය වන්නේ මෙයයි : වර්ෂ 1995 දී මූල්‍ය පරතරය අඩු කිරීම සඳහා අප අනුගමනය කරන ක්‍රියාමාර්ගය නිසා පෞද්ගලික අංශයේ ප්‍රසාරණයට හානිකර වන අයබදු අයකිරීමේ ක්‍රියා මාර්ග නොගැනෙනු ඇත. සංස්ථාමය හෝ පෞද්ගලික ආදායම් වලින් අය කෙරෙන අය බදු වල වැඩිවීමක් සිදු නොකෙරෙනු ඇත. එමෙන්ම ධනය හෝ මූලධන වර්ධනයන්ගෙන් බදු අය කිරීමක් හෝ කොටස් ගනුදෙනු මත මුද්දර ගාස්තු අය කිරීමක් හෝ සිදුවන්නේ නැත. ආදායම් ක්‍රියාමාර්ග පිළිබඳ විස්තරාත්මක තොරතුරු අයවැය ලේඛණය මගින් ප්‍රකාශයට පත් කරන්නෙමු.

සතරවන සාධකය නම් මූලික වශයෙන්ම රජයේ වියදම් අඩු කිරීම මගින් ම මූල්‍ය පරතරය අඩු කිරීමයි. ආණ්ඩුවේ ඉහළ තැන්වල සිටම නිශ්ඵල නාස්තිකාර වියදම් තුරන් කර දැමීමට රජය දැනටමත් පියවර ගෙන තිබේ. සුඛෝපභෝගී ජීවන රටාවන් හා අමාත්‍යවරුන් භාවිතා කෙරෙන සුඛෝපභෝගී වාහන ප්‍රමාණයන් කපා හැර ඇත. දූෂණය තුරන් කිරීමට අරඹා තිබෙන සටන නිසා දැනටම රජයේ වියදම් අඩුවීමක් පෙනෙන්නට පටන් ගෙන තිබේ. මේ අතින් ඉතා විශාල මුදල් ප්‍රමාණයන් රජයට ඉතිරි කර ගත හැකිව තිබේ. රජයේ මූලධන වියදම ප්‍රධාන වශයෙන් ම රාජ්‍ය අංශයට පමණක් ක්‍රියාත්මක කළ හැකි මූලික වැඩ කටයුතු වලට සීමා කෙරේ. අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, වෘත්තීය පුහුණුව, පාරිසරික ආරක්ෂාව, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය යන මේවා ප්‍රධාන වශයෙන් ම එම මූලික කටයුතු අතරට වැටේ.

පස්වන සාධකය නම්, අංග සම්පූර්ණ "සමාජ ආරක්ෂක පියවර ජාලයක්" සැපයිය හැකිවන්නේ රාජ්‍ය අංශයට පමණක් ය යන්නයි. මෙම පියවර රජයේ සමෘද්ධි වැඩ සටහනට අන්තර්ගත වී තිබේ. දැනට පවත්නා සුභ සාධන හා දිළිඳුකම පිටුදැකීමේ වැඩ සටහන්වල ප්‍රතිලාභ සැබැවින්ම දිළිඳු තත්ත්වයේ පසුවන කොටස් වලට අත්වන ලෙසට එම වැඩ සටහන් සමෘද්ධි වැඩ සටහන විසින් ඒකාබද්ධ කොට නියි දිසාවකට යොමු කෙරෙනු ඇත. දිළිඳු තත්ත්වයේ පසුවන පුද්ගලයන්ට අවම තත්ත්වයෙන් සතුටුදායක ජීවන මට්ටම් ලබා දීමට හැකිවන අයුරු සමෘද්ධි වැඩ සටහන් යටතේ ආදායම නියි ලෙස බෙදා හැරීමක් සිදු කෙරෙනු ඇත. ඒ එක්කම එම වැඩ සටහන යටතේ දිළිඳු පුද්ගලයින්ට ශක්තිමත් හා ස්ථිරසාර ජීවනෝපායන් අත්කර ගැනීමට අවකාශ ලැබෙන පරිදි ඔවුන්ගේ ශක්තීන් ඒකරාශී කොට මෙහෙයවනු ඇත.

හයවන සාධකය වන්නේ වෙනත් අවශ්‍ය ආයෝජනයන් කිරීමේ වියදම් බර විශේෂයෙන්ම යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වියදම් බර, පෞද්ගලික අංශය වෙතට භාර කිරීමයි. උදාහරණයක් වශයෙනේ දක්වතොත්, විදුලිබල සංවර්ධනය සඳහා සිදු කෙරෙන ආයෝජන මින්මතු "ගොඩනගා හිමිකොටගෙන ක්‍රියාත්මක කිරීම" "ගොඩනගා ක්‍රියාත්මක කර පැවරීම" (B.O.O. සහ B.O.T.) යන පදනම මත සිදු කිරීමට ධෛර්ය දෙනු ඇත. වේගයෙන් කාර්මික සංවර්ධනයට භාජනය වන රටවල අනුගමනය කරනු ලබන පිළිවෙළ මෙයයි. මෙම පදනම මත විදුලි බල නිෂ්පාදන හා විදුලි සංදේශ ව්‍යාපෘති කිපයක්ම ගොඩනැගීම පෞද්ගලික අංශයට භාර කිරීමට රජය දැනටම පියවර ගෙන තිබේ. වරාය සංවර්ධනය කිරීම සඳහා කෙරෙන ආයෝජනයන් ද ඒ ක්‍රමය අනුව සිදු කෙරේ.

ශ්‍රී ලංකාවට නවීන යුගයට පිවිසීම සඳහා අවශ්‍ය වන ප්‍රධාන මහාමාර්ග පද්ධතිය පෞද්ගලික අංශයේ ආයෝජන මගින් ගොඩනැගීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ඇත. මෙම වැඩපිළිවෙලේ ප්‍රතිඵලය ලෙසට අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, වෘත්තීය පුහුණුව, පාරිසරික ආරක්‍ෂාව, ග්‍රාමීය සංවර්ධනය යන අංශ සඳහා වැඩි

වැඩියෙන් රාජ්‍ය අංශයේ සම්පත් යෙදවීමේ අභියෝගයට සාර්ථකව මුහුණදීමට හැකි වනු ඇත.

රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිසංස්කරණය කිරීම

සත්වෙනුව, 1995 වර්ෂය තුළදී රාජ්‍ය අංශයේ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම ඇරඹෙනු ඇත. විශේෂයෙන්ම ගුවන් සේවා, ගමනාගමන සහ රක්ෂණ ඇතුළත් සේවා අංශයේ ප්‍රධාන ව්‍යාපාර මේ වැඩ පිළිවෙලට ඇතුළත් වනු ඇත. එමෙන්ම සීනි, කඩදාසි, පොහොර හා කිරි යන කර්මාන්ත සහ වාණිජ කටයුතු පෞද්ගලික අංශයට මාරු කිරීම ලඟදීම අවසන් කරනු ඇත. එමෙන්ම ව්‍යාපාරවල රජය සතු විශාල කොටස් හිමිකම් ද වෙළඳපොලෙහි විකුණනු ඇත. වතු වැවිලි අංශයේ කළමනාකරණය දිගු කාලීන වශයෙන් බදු දීමට ද රජය අදහස් කරයි. රාජ්‍ය ආයතන කළමනාකරණය සඳහා පුද්ගලික අංශයට ආරාධනා කෙරෙනු ඇත. එය කරනු ඇත්තේ රටේ සේවක කොටස්වල පලප්‍රයෝජන ආරක්ෂා කිරීම අරමුණු කොටගෙන ඒවායේ අයිතිය ආණ්ඩුව වෙත තබා ගනිමිනි.

මෙය කරනු ඇත්තේ යහපත් කළමනාකරණය හා එම ව්‍යාපාරවල කළමනාකරණය භාරගන්නා පෞද්ගලික අංශයට ඒවායේ ලාභ සහගත කෙරෙන තත්වයන් ද ආරක්ෂා කරමිනි. පෞද්ගලිකකරණය කෙරෙන රාජ්‍ය අංශයේ හැම සමාගමකම කොටස් ප්‍රමාණයක් එහි සේවකයින්ට විශේෂයෙන්ම වෙන්කොට දීමට ක්‍රියාකරනු ඇත.

රාජ්‍ය අංශයේ සේවකයින්ට හා විශ්‍රාමිකයින්ට ද එලෙස ව්‍යාපාර කොටස් හිමිකර දිමේ සංකල්පය ව්‍යාප්ත කිරීමට අපි අදහස් කරන්නෙමු. ජාතික යහපත තකා යම් යම් අංශවල හා අවස්ථාවල, නව තාක්ෂණය, කළමනාකරණ දක්ෂකම්, මූල්‍යමය සම්පත් යන මේවා හඳුන්වාදීමේ හා ලබා ගැනීමේ අරමුණින් සංවර්ධන මුලෝපාය අතින් වැදගත් වන ආයෝජකයන් ද විශේෂ තත්වයන් යටතේ කැඳවා ගැනීම අවශ්‍ය වනු ඇත.

රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලිකකරණය කිරීමේ ප්‍රතිඵලය ලෙසට සිදුවනු ඇත්තේ රාජ්‍ය අංශයේ අත්‍යවශ්‍ය අයෝජනයන් සඳහා වන

සම්පත් අරපිරිමැසීම සහ වර්ධනය වීම පමණක් නොවේ. ඒ මගින් පෞද්ගලිකකරණය කළ අංශවල මෙන්ම සමස්ථයක් වශයෙන් මුළු මහත් ආර්ථිකය තුළ ද ආයෝජන, සේවා නියුක්තිය සහ සේවාවන්හි ද ගුණාත්මක අගයේ වැඩි වර්ධනයක් සිදුවනු ඇත. පෞද්ගලිකකරණය තුළින් ජනිත කර ගත හැකි සැළකියයුතු ආදායම් ප්‍රමාණයන් ප්‍රධාන වශයෙන් රාජ්‍ය ණය පියවීමට යොදා ගනු ඇත. මෙම පියවර හේතු කොටගෙන පොළී ගෙවීම සඳහා වැයවන විශාල මුදල් ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට රජයට හැකි වන අතර, ඉකුත් කාලසීමා වලදී අනුගමනය කොට ඇති පාලනයෙන් තොර නාස්තියට තුඩුදෙන මූල්‍ය ප්‍රතිපත්ති නිසා ගොඩනැඟී තිබෙන "ණය උගුලෙන්" මිදීමට හැකි වනු ඇත. පෞද්ගලිකකරණයේ දීඝ කාලීන හා සමස්ථ ප්‍රතිඵලය වනු ඇත්තේ සේවා නියුක්තිය ඉහළ නැංවීම වුවද, පුද්ගලයින්ගේ රැකියාවල ස්වභාවය වෙනස්වීම නිසා තාවකාලික දුෂ්කරතා පැන නැඟිමට ඉඩ තිබේ. එබඳු සෑම අවස්ථාවකම සේවකයින්ගේ අයිතිවාසිකම් අරක්ෂා කිරීමට නොපැකිළව ඉදිරිපත් වන බවට රජය ස්ථිරවම පොරොන්දු වේ. පෞද්ගලිකකරණය සම්බන්ධයෙන් අනුගමනය කරන ප්‍රතිපත්තියේ ප්‍රධාන ලකෂණ වන්නේ සර්ව සම්පූර්ණ වශයෙන් ම වූ විවෘත භාවය හා වගකීමට බැඳී සිටීමයි. මෙය අතීතයේ දී කිසිසේත්ම සිදු නොවූවකි. ගැත්තන්ට වාසි ලබා දෙන පෞද්ගලිකකරණය කිරීමක් මින්මතු සිදු නොවනු ඇත.

අට වෙනුවට, ශ්‍රී ලංකාවට මෙම කළාපයේ ප්‍රධාන මූල්‍ය සේවා හා ප්‍රතිනැව්ගත කිරීමේ මධ්‍යස්ථානය බවට පත්වීමේ අරමුණ ඉටු කර ගැනීමට හැකිවන්නේ මෙම විවිධ වූ ප්‍රතිපත්ති මාර්ගයෙන් එකට එක්ව සංවර්ධනය වීමේ ප්‍රතිඵලය ලෙසටය. ලෝකයේ මූල්‍ය කටයුතු ක්ෂේත්‍රයේ ක්‍රියාකරීවන ප්‍රධාන පෙලේ බලවේගයන් කොළඹ නගරයට ගෙන්වා ගැනීමට ශ්‍රී ලංකාවට තවමත් අවස්ථාව තිබේ. මේ සඳහා අවශේෂ ලෝකයේ සිදුවන සීඝ්‍ර තාක්ෂණික පරිවර්තනයන් සමඟ ඉදිරියට යෑමට සමත් කාර්යක්ෂම හා තරඟකාරී විදුලි සංදේශ සංනිවේදන සේවයක් ගොඩ නැගීම අත්‍යවශ්‍යය. වරායන්හි ප්‍රමාණවත් සංවර්ධනයක් සිදුවුව හොත් දැනට කොළඹ වරාය පසුකර යන විශාල නැව් බඩු ප්‍රමාණයකට සේවා පහසුකම් සැපයීමට හැකි වනු ඇත. වරාය සංවර්ධනය කිරීම සඳහා ප්‍රාග්ධනය ආයෝජනය කිරීමට ප්‍රධාන පෙළේ ජාත්‍යන්තර සමාගම් දැනටම උනන්දුව පළ කර තිබේ.

මෙම සංවර්ධන මූලෝපායට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි හා ලෝක බැංකුවේ මෙන්ම බොහොමයක් ජාත්‍යන්තර ආධාර දායකයින්ගේත් පුළුල් සහාය පළ වී තිබේ. මේ අනුව තවදුරටත් ශ්‍රී ලංකාවට ආධාර ලබා හැකි තත්ත්වයක් නැවත ගොඩ නගනු ලබනවා ඇත. අප රටේ සාමය ඇති වුවහොත්. ප්‍රතිසංවර්ධනය සහ පුනරුත්ථාපන කටයුතු සඳහා වඩ වඩාත් ජාත්‍යන්තර ආධාර ලබා ගත හැකි වනු ඇත.

මෙම ආර්ථික මූලෝපාය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සමස්ථ ආර්ථික සංවර්ධන ඉදිරි දර්ශනයකුත් ඊට ආධාරකාරී වන අංශයීය ආර්ථික ප්‍රතිපත්තියකුත් අවශ්‍යය. මේ අනුව මෙහි පහතින් විස්තර කෙරෙනු ඇත්තේ අපේ අනාගත ආර්ථික වර්ධන ඉදිරි දර්ශනයයි. පෞද්ගලික අංශයේ ඉතා කඩිනමින් ක්‍රියාත්මක වන්නට සැලැස්විය යුතු ආර්ථික වර්ධන ක්‍රියාවලියද එයට ඇතුළත් වනු ඇත. කර්මාන්ත, වාණිජ්‍යය, ධීවර කර්මාන්තයේ, යටිතල පහසුකම්, මානව සංවර්ධනය ; (එනම් රජයේ සමාජ ආරක්ෂණ ජාලය) සහ සමෘද්ධි ව්‍යාපාරය ගැන ද එයින් විස්තර කෙරෙනු ඇත.

## ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දර්ශනය - 1995 - 2000

දිළිඳු බවත්, විරැකියාවත්, තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථිකය මීට පෙර සිදු වූවාට වඩා බෙහෙවින් වේගවත් ප්‍රමාණයකින් වර්ධනය වීම අවශ්‍යය. ආර්ථික වර්ධන වේගය වර්ෂයට සියයට 8 දක්වා වැඩිවන සේ එම වර්ධන වේගය කඩිනම් කිරීමටත්, එම වර්ධන වේගය පවත්වා ගැනීමට නොපසුබස්නා වීර්යයෙන් වැඩ කිරීමටත්, අපි බැඳී සිටිමු. මේ සඳහා ආයෝජනයේ සැළකිය යුතු වැඩිවීමක් අවශ්‍ය වේ. අපගේ ජාතික ඉතිරිකිරීම් වලින් හතරෙන් පංගුවක්ම උතුරු නැගෙනහිර ගැටුම සම්බන්ධයෙන් වැයවෙයි. මේ සම්බන්ධයෙන් අතියමින් වැයවන ධනය මීට වඩා බෙහෙවින් වැඩිය. දෙපාර්ශ්වය අතර එදිරිවාදිකම් නැවැත්වීම කරණ කොටගෙන උතුරු නැගෙනහිර ඇති වන සාමය නිසා අන්තිමේදී දේශීය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 2 ක ප්‍රමාණය

("සාමයෙන් අත්වන ලාභය") රජයේ ඉතිරිකිරීම් වලට එක්වනු ඇත. ඒ අතර, ආයෝජනයේ බර ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය මත පැවරෙනු ඇත. රාජ්‍ය අංශයේ ආයෝජනය වත්මන් මට්ටමෙන් පවත්වා ගැනීමට හැකිවන අතර පෞද්ගලික අංශයේ ආයෝජනය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 25 ක ප්‍රමාණය දක්වා වැඩි විය යුතුය. මෙම අරමුණ ඉටුකර ගතහැකි යයි අපි විශ්වාස කරමු. නමුත් මෙම තත්වය උදාවීම සඳහා අපගේ ආර්ථික ප්‍රතිපත්ති හා ආර්ථික කළමනාකරණ කාර්යසාධනය මැනවින් ගැලපුණු හා පැහැදිලි එකක් විය යුතුවාක් මෙන්ම එහි ප්‍රතිඵලය කුමක් විය හැකිද යන්න කල්තබාම සිතාගත හැකි එකකුත් විය යුතුය. එමෙන්ම, මෙරට යහපත් ආයෝජන වාතාවරණයක් පවත්වා ගැනීමට හැකි හැම පියවරක්ම අපි ගන්නෙමු.

මෙම ආර්ථික වර්ධන අරමුණ සාක්ෂාත් කර ගැනීමෙහි ලා විදේශීය ආයෝජනයන්ගෙන් ඉටු වීමට තිබෙන කාර්ය භාරය ඉතාම වැදගත්ය. වර්ෂ 2000 වන විට මෙරට විදේශීය ආයෝජන යටත් පිරිසෙයින් සම්පූර්ණ පෞද්ගලික ආයෝජනයෙන් පහෙන් එක් පංගුවක් (1/5) වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ආයෝජනයට යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම නිෂ්පාදනයත් ඇතුලත් වනු ඇත. ශ්‍රී ලංකාවේ විදේශීය ආයෝජනය වර්ධනය වීමට පවතින ප්‍රධාන බාධකය නම් බොහෝ සෙයින් ජාතික සම්පත් වැයවීමට හේතුවී තිබෙන්නාවූත්, බොහෝ කලක සිට පවතින්නාවූත්, ජනවාර්ගික ගැටුමය. මෙම ප්‍රශ්නයට රජය ඉදිරිපත් කරන විසඳුම වන්නේ දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා හා ද්‍රවිඩ ජනතාව අතර ඇතිකොට ගන්නා ලද ගිවිසුම, එනම් "බණ්ඩාරනායක – චෙල්වනායගම් ගිවිසුම" ආරම්භය කොටගෙන ඒ වෙතින් ඉදිරියට යාමය. ද්‍රවිඩ ජනතාවට උපරිම වශයෙන්ම පවරා දිය හැකි බලතල පවරා දෙන අතර තුර එක්සත් ශ්‍රී ලංකාවක් පවත්වා ගැනීමට එම ගිවිසුමේ නිර්මාතෘවරු කැප වී සිටියහ.

සුදුසු විදේශීය ආයෝජන මෙරටට කැඳවා ගැනීමට අපගේ රජය ලෝකයේ ප්‍රධානතම සමාගම් වලට සහ ප්‍රාග්ධන අරමුදල්

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

කළමනාකරණ සමාගම්වලට ප්‍රමුඛත්වය දෙනු ඇත. කාර්මික සහ මූල්‍ය අංශවලට ව්‍යාප්ත වීම සඳහාත්, දියුණු තාක්ෂණය සහ නිර්යාත වෙළඳ පොලවල් වෙත ළඟා වීම සඳහාත් මෙය අත්‍යවශ්‍යය. විදේශීය ආයෝජන සම්බන්ධයෙන් අපගේ කම්කරු ප්‍රතිපත්තියෙහි කිසිත් අහිතකර වෙනසක් ඇති නොකරන බවට ඉකුත් සැප්තැම්බර් මාසයේදී ප්‍රකාශයට පත් කල අපගේ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් දෙන ලද ප්‍රතිඥාවට අපගේ ඇති බැඳීම නැවතත් සහතික කොට ප්‍රකාශ කරමු. තම හාම්පුතුන් හා සාමූහික කේවෙල් කිරීමෙහි යෙදීමට සේවකයින්ට ඇති අයිතියට රජය ගරු කරයි. මෙම අරමුණ සඳහා සමථ ක්‍රියාදාමයක් සඳහා අවශ්‍ය සංවිධානමය වැඩපිළිවෙල රජය විසින් පිහිටුවා තිබේ. ව්‍යාපාරයන්හි ඵලදායීතාව වැඩිදියුණුවට පත්කිරීම වෙනුවෙන් සේවකයින්ට වැඩි වැටුප් වශයෙන් ප්‍රතිලාභ ලැබෙන්නට සැලැස්විය යුතු බව අපගේ විශ්වාසයයි. එසේ වුවද, ආර්ථික වර්ධනය සඳහා වූ ජාතික මූලෝපාය කඩාකප්පල් කිරීම සඳහා කුඩා කණ්ඩායම් විසින් සිතාමතාම සිදුකරන නීතිවිරෝධී වූත් වගකීමෙන් තොර වූත් ක්‍රියාවන්ට කිසි සේත් ඉඩ නොදෙනු ඇත. කාර්මික සම්බන්ධතා පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිපත්තියෙන් නව කම්කරු ප්‍රඥාප්තියක් ප්‍රකාශයට පත්වෙනු ඇත. දැනට රැකියා අවස්ථා ලබා සිටින පුද්ගලයන්, රැකියා විරහිතව සිටින විශාල ජනකායට රැකියා ලබා ගැනීමට තිබෙන අයිතියට ගරු කළ යුතු බව රජය අවධාරණය කරයි. අවශ්‍යව තිබෙන එම අතිරේක රැකියා අවස්ථා ඇති කොට ගැනීමට අඛණ්ඩවම හා වැඩි වැඩියෙන් මෙරටට විදේශීය ආයෝජන පැමිණීම තීරණාත්මක ලෙස වැදගත් වේ.

අංශයීය ප්‍රතිපත්ති :

1. කාර්මික ප්‍රතිපත්තිය

කාර්මික ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාකාරී වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට රජය බලාපොරොත්තු වේ.

* අපගේ ආර්ථික ප්‍රතිපත්තිය ආසියාවේ ඉහළ මට්ටමක වර්ධනයක් ලබමින් ක්‍රියාත්මක වන ආර්ථිකයන් ලබා ඇති අත්දැකීම පදනම්කොට සකසා ගත් එකකි. උද්ධමනය සහ

පොලී අනුපාත අඩු කිරීමට තුඩුදෙන සාර්ව ආර්ථික ස්ථායීතාවයක් ඇති කිරීම තුලින් පරිසරයට හිතකර සහ තිරසාර කාර්මික වර්ධනයක් සඳහා ආණ්ඩුව ක්‍රියා කරනු ඇත. මෙම තත්වයන් වඩාත් විවෘත වෙළඳ ක්‍රමයක් හා නම්‍යශීලී විනිමය අනුපාතයක් සමග එක්වූ විට, බෙහෙවින් ප්‍රාණවත්ව ක්‍රියාත්මක: වන්නාවූත්, ජාත්‍යන්තර වශයෙන් සාර්ථකව තරඟකාරිවූත්, අපනයනයට යොමුවූ හා විවිධාංගිකරණයට පත්කරන ලද්දාවූත්, කාර්මික අංශයක් බිහි වනු ඇත. එය වඩ වඩාත් තාක්ෂණික නවීකරණයටද භාජනය වෙනු ඇත. පරිසරය දූෂ්‍ය නොකරන උසස් තාක්ෂණික කර්මාන්ත මෙරටට ගෙන්වා ගැනීම යෝග්‍ය වන අතර, ඒ සමගම ඇඟලුම් කර්මාන්තයෙන් පිටස්තරව ඇති පරිසරයට හානි නොපමුණුවන සහ ශ්‍රම සූක්ෂම කර්මාන්ත දියුණු කිරීමට තවදුරටත් ඉඩකඩ තිබේ. ප්‍රාග්ධනය සැපයීමෙන් හා අඛණ්ඩවම වඩාත් උසස් තාක්ෂණයන් හා අපනයන වෙළඳ පොලවල් ලබාදීමෙන් මෙම ක්‍රියාදාමයට ඉතා වැදගත් සේවයක් කිරීමට විදේශීය ආයෝජකයනට හැකියාව ඇත.

* අපගේ රජය විවෘත හා ඉතාමත් පැහැදිලි නීතිමය රාමුවක් හා වෙළඳ පොලට හිතකර ආයෝජන වාතාවරණයක් පෞද්ගලික අංශයට සපයා දෙනු ඇත. අවශ්‍යතා සැපයීමට වෙළඳපොළ පැහැදිලිවම අසමත් වන ක්ෂේත්‍රයන්ට පමණක් රජයේ මැදිහත් වීම සීමා කෙරෙනු ඇත. නිෂ්පාදන, කර්මාන්තයෙහි හා සේවාවන්හි අංශයිය ප්‍රතිපත්ති නිසි අයුරින් සංවර්ධනය කිරීම හා සම්බන්ධීකරණය කිරීම සහතික කරනු පිණිස, රජයේත්, පෞද්ගලික අංශයේත්, විවිධ වෘත්තීන්ට හා වෘත්තිය සමිති වලටත් අයත් නියෝජිතයින්ගෙන් සමන්විත ජාතික සංවර්ධන මණ්ඩලයක් පිහිටුවනු ලැබේ.

* අකාර්යක්ෂම කර්මාන්ත ආරක්ෂා කිරීම ශීඝ්‍ර හා ස්ථාවර කර්මාන්ත සංවර්ධනයට හා සමාජ සාධාරණත්වයට පටහැනිය. ආසියාවේ චීනය හා වියට්නාමය ඇතුළු වේගවත් වර්ධනයෙන් යුත් ආර්ථිකයන් විසින් එබඳු

ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කර තිබේ. වෙළඳාම ලිහිල් කිරීමේ ප්‍රතිපත්තියක් තුලින් කර්මාන්ත අංශයේ කාර්යක්‍ෂමතාව අඛණ්ඩවම වැඩි දියුණුවට පත් කෙරෙනු ඇත. දැනට පවත්නා බහුවිධ තීරු ගාස්තු ක්‍රමය පියවරෙන් පියවර වඩාත් සරල බවට පත් කොට, වර්ෂ 1998 වන විට සියයට 15කට වඩා වැඩි නොවන ඒකීය ආනයන තීරු ගාස්තුවක් හඳුන්වා දීමට ක්‍රියා කරනු ඇත.

* දැනට තිබෙන ආයෝජන දිරි ගැන්වීම් ක්‍රමය පරස්පරතා, එක සමානව ක්‍රියාත්මක නොවන සහ හිතුවක්කාර අධිකාර අය කිරීම් සහ තීරු බදු සහන යනාදියෙන් ගහණයි. මේ ක්ෂේත්‍රයේ සුදුසු වෙනස්කම් ඇති කිරීමටත්, වඩාත් සරල සහ විනිවිද පෙනෙන දිරිගැන්වීම් ක්‍රමයක් හඳුන්වා දීමටත්, ආණ්ඩුව පියවර ගන්නවා ඇති. ඒ මගින්, දැනට ක්‍රියාත්මක වන නිදහස් වෙළඳ ප්‍රතිපත්තියේම අංගයක් වශයෙන්, දූෂණය සහ අකාර්යක්ෂමතාවය පිටු දැකීමට හැකි වේ. එමෙන්ම, දීර්ඝ බදු සහන කාල පරිච්ඡේද අහෝසිකර, ඒ වෙනුවට අවුරුදු විස්සක කාලයක් තෙක්, නිර්යාත ලාභ වලින් 15%ක් බදු අයකිරීමේ දැනට හඳුන්වා දී ඇති ක්‍රමය දිගටම ක්‍රියාත්මක වෙනු ඇත.

* පළල් ලෙස පැතිරෙන කාර්මික කරණයේත්, සේවා නියුක්ති අවකාශ වර්ධනය වීමේත්, ආධාරකයක් වන කුඩා සහ මධ්‍යම පරිමාණයේ කර්මාන්ත අංශයක් පිහිටුවීමට ආණ්ඩුව ආධාර කරනු ඇත. එසේ වුවත්, එම ආධාර සපයනු ඇත්තේ, අතීතයේදී සිදු වූ පරිදි මහජන මුදල් නාස්තියටත්, පාරිභෝගිකයින්ට තත්වයෙන් බාල භාණ්ඩ අධික මිලට සැපයීමටත් තුඩුදුන් ආරක්‍ෂණවාදී ප්‍රතිපත්ති කරා ආපසු යාම මගින් නොවේ. තමන්ගේම සම්පත් ප්‍රමාණවත් තරමට නැති සහ වානිජ බැංකු වලින් ණය ලබාගැනීමට අවශ්‍ය ඇපකර සොයා ගැනීමට අපහසු කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාරිකයින්ට ආධාර කරනු පිණිස, ව්‍යාපාර කොටස් අරමුදලක් හෝ ණය අරමුදලක් පිහිටුවීම වැනි ක්‍රියාමාර්ගයක්

ගැනීම ගැන ආණ්ඩුව සැළකිල්ල දක්වයි. මේ මගින් අවුරුදු 5 ක කාලයක් තුලදී 250,000 කට, එනම් මුළු ඇඟලුම් කර්මාන්තයෙන්ම සපයා ඇති රැකියා වලට සමාන ප්‍රමාණයක, රැකියා අවස්ථා නිර්මාණය කිරිමට සමත් වන කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ කර්මාන්ත 20,000 ක් පිහිටුවීමට බලාපොරොත්තු වෙමු. විශාල පරිමාණ සහ නවීන කර්මාන්ත කරුවන් සමග සම්බන්ධතා ඇති කිරිම සහ පුහුණුව මගින් සිදුවන තාක්‍ෂණ ගලා ඒම මගින්, කුඩා සහ මධ්‍යම කර්මාන්ත ශක්තිමත් කිරීමටද හැකි වනු ඇත.

* ඉතා ඉහළ සාක්‍ෂරතාවයක් ලංකාවේ තිබුණත්, අපේ ශ්‍රම බලකාය කාර්මික තත්වය ඉහළ නැංවීමේදී සහ විවිධාංග කරණය කිරීමේදී අත්‍යවශ්‍ය වන නිපුණතා වලින් ඌණය. රජය මගින් පවත්වාගෙන යන විවිධ, නිපුණතා - සංවර්ධන වැඩ සටහන් සහ පොදු අධ්‍යාපන ක්‍රමය මූලික වශයෙන්ම, ආර්ථිකයේ ඉල්ලුමට අනුව සකස් වූ ඒවා නොවන අතර, කර්මාන්ත ක්‍ෂේත්‍රයට අවශ්‍ය ප්‍රගුණතා සැපයීම සම්බන්ධයෙන් ඒවාට ඇත්තේ දුර්වල වාර්තාවකි. එබැවින් ආර්ථිකයේ හා ශ්‍රම වෙළඳ පොලේ ඉල්ලුම මගින් මෙහෙයවන පරිදි වෘත්තීය අධ්‍යාපන ක්‍රමය පුළුල් ලෙස ප්‍රතිසංවිධානය කෙරෙනු ඇත. එසේ කිරීමේදී, අනාගත සේවායෝජකයන් වන පෞද්ගලික අංශයේ සහයෝගයද ලබා ගැනේ. එමෙන්ම නිපුණතා පුහුණුව ලබා දීම අරමුණු කරගත් සාර්ථක වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් ගොඩ නැගීමට නිපුණතා සංවර්ධන අරමුදලක් ද පිහිටුවනු ඇත.

එමෙන්ම පෞද්ගලික අංශයේ සක්‍රීය සහභාගිත්වය ඇතිව ආණ්ඩුවේ කාර්මික පර්යේෂණ හා සංවර්ධන ආයතන ඉතා පුලුල් ලෙස ප්‍රතිසංවිධානය කෙරේ. ඒ මගින් කර්මාන්ත අංශයේ තාක්‍ෂණික අවශ්‍යතා ඉටු කිරිමටත්, ජාත්‍යන්තර වෙළඳ පොලේ දී අපේක්‍ෂා කරන තරඟකාරී මිල ගණන්, ගුණාත්මක තත්වය සහ බෙදා හැරීමේ ප්‍රමිතීන් අත්පත් කර ගැනීමටත්, ඔවුන්ට සහාය වීමට හැකි වනු ඇත.

ප්‍රාදේශීය සංවර්ධනයේ අරමුණ ඇතිව, පරිසරයට හානි නොපමුණුවන කුඩා ප්‍රමාණයේ කර්මාන්ත ග්‍රාමීය ප්‍රදේශ වල පිහිටුවීමට ආණ්ඩුව දිරි දෙනු ඇත. මේ ප්‍රදේශ වල පෞද්ගලික ආයෝජන දිරි ගැන්වෙන පරිදි යටිතල පහසුකම් ද වර්ධනය කරන්නෙමු.

කෘෂිකර්මය පදනම් කොට ගත් කර්මාන්ත උනන්දු කරවීමටත්, නිමි කෘෂි භාණ්ඩ නිෂ්පාදනය කිරීමටත් ආණ්ඩුව ප්‍රමුඛතාවයක් ලබා දෙයි.

## 2. වෙළඳ ප්‍රතිපත්තිය

මිළ පාලනය මගින් භාණ්ඩ මිළ ඉහල යෑම නැවැත්වීම පිණිස ක්‍රියාත්මක වූ වෙළඳාම පාලනය කිරීමේ ප්‍රතපත්ති වල අසාර්ථක බව හොඳින් දැක ඇති මගේ ආණ්ඩුව, භාණ්ඩ නිෂ්පාදනය හා බෙදා හැරීමේ ක්ෂේත්‍රයන්හි සක්‍රිය තරඟ කාරිත්වය දිරි ගැන්වීමට මුළුමනින්ම කැපවී සිටියි. ඇතැම් කාල වලට නැතහොත් කෘත්‍රිම ලෙස වෙළඳපොලේ බඩු හිඟවීම සිදු වන විට, එම බඩු හිඟය මග හැරවීමටත්. මිළ ගණන් ස්ථාවර කිරීමටත් අත්‍යවශ්‍ය භාණ්ඩ වෙළඳ පලේ තිබෙන බව සහතික කිරීමටත්, සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ සහභාගිත්වය යොදා ගැනීමට ආණ්ඩුව ක්‍රියා කරනු ඇත. එහෙත් මේ සීමිත මැදිහත් වීම, තරඟකාරී වෙළඳ පොළ නැති කිරීමටවත්, දුර්වල කිරීමටවත් යොදා නොගැනේ.

එමෙන්ම, බලපත්‍රදීම, පිළිවෙලක් නැතිව කරන අධිභාර අයකිරීම් සහ ආරක්ෂණ සහ සෞඛ්‍ය හේතූන් හැර අන් හේතූන් මත කරන පාලනයන් යන මේවා අහෝසි කෙරේ. ආයාත බදු පියවරෙන් පියවර අඩුකර, සරල කෙරෙනු ඇත. එහි අරමුණ, දේශීය ආර්ථික කටයුතු ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී තත්වයකට ගෙන ඒමයි. ඒ මගින් අවසානයේ දී නිර්යාත දිරි ගැන්වෙනු ඇත. නිර්යාත වෙළඳ පොළවල් අත්පත් කරගෙන, පවත්වා ගෙන යෑම මගින් නිර්යාත මූලික ආර්ථික වර්ධනය තවදුරටත් දිරිමත් කරවනු ඇත. නම්‍යශිලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මගින් නිර්යාත වර්ධනයට තිරසාර බවක් ලබා දෙනු ඇත.

## 3. කෘෂිකාර්මික ප්‍රතිපත්තිය

ග්‍රාමීය කෘෂිකර්මයත්, ගැමි ජනතාවත් පත්වී තිබෙන ඛේදනීය තත්වය තරම් මෑත අතීතයේ ක්‍රියාත්මක වූ රාජ්‍ය ප්‍රතිපත්ති වල අසාර්ථකත්වය පෙන්නුම් කරන තවත් දෙයක් නැති තරම්ය. කෘෂිකර්මය පිළිබඳව කොතරම් මහ හඬින් කෑ ගැසුවත් ගිය ආණ්ඩුවේ ප්‍රතිපත්ති වලින් සිදු වූයේ අනෙකුත් අංශ සමග අවාසිදායක තත්වයක සිට තරඟ කිරීමට, කෘෂිකර්ම අංශය තල්ලු කිරීමයි. මේ අතර කාර්මික අංශයට දී තිබුනු ඉහල මට්ටමේ ආරක්ෂණයන් නිසා, කෘෂි අංශයට බරපතල අවාසි සිදු විය. කෘෂිකර්මයේ ලාභදායීත්වය අඩු කිරීමටත්, එම අංශය තුළ ආයෝජන සීමා කිරීමටත් තුඩු දුන් ආයතනික හා ප්‍රතිපත්තිමය බාධකයන් ඉවත් කිරීමට ආණ්ඩුව පියවර ගනු ඇත. මේ අතර කෘෂි කාර්මික ක්ෂේත්‍රය තුල රජය කරන මැදිහත් වීම වෙළඳ පොළ දියුණු කිරීම වෙත යොමු වනු ඇත. ඒ මගින් ගොවීන්ට සිය නිෂ්පාදනයන්ට නිසි මිලක් ලබා ගැනිමටත්, යෙදවීම් සහ තාක්ෂණය ලබා ගැනීමටත් හැකි වනු ඇත.

වෙනත් වචන වලින් කියන්නේ නම්, නව කෘෂිකාර්මික සංවර්ධන මුලෝපායයන් සකස් කරනු ඇත්තේ අපේ ගොවි ජනතාවගේ නිර්මාණාත්මක ශක්තිය සහ ස්වාධීනත්වය නිලධර තන්ත්‍රය සහ අධික පාලන නීති රීති මගින් මොට නොවන බව සහතික කරමිනි. යථාර්ථවාදී තීරණ ගැනීමට සහ තෝරා ගැනිම් කිරීමට ගැමි ජනතාව තුළ ඇති ශක්තිය ගැන අප තුල විශ්වාසයක් තිබේ. කෘෂිකර්මය සම්බන්ධ ආණ්ඩුවේ ප්‍රතිපත්තියේ පුළුල් ගමන් මග වනු ඇත්තේ ගොවීන්, ධීවරයින් සහ අනෙක් කෘෂිකාර්මික කම්කරුවන්ට, දැනට තිබෙන ආර්ථිකමය එකතැන පල් වීම නවතා, සෞභාග්‍යය කරා ළඟා විය හැකි පරිදි, ඔවුන් වඩාත් විවෘත, අභියෝගකාරී සහ තරඟකාරී පරිසරයකට මාරු වීමට සහාය වීමයි.

එවැනි පරිවර්තනයක් ඇති කර ගැනිමට නම් වැදගත් ව්‍යුහාත්මක වෙනස් කම් ගණනාවක්ද අවශ්‍ය වේ. ශීඝ්‍රයෙන් වර්ධනය වන ආර්ථිකයක් තුළ කෘෂිකාර්මික නිෂ්පාදකයන්

තවමත් සිටින්නේ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් මිල පහත වැටීමේ ප්‍රවණතාවයක් දක්වන පාරිභෝජන භාණ්ඩ නිපදවීමේ ක්‍රියාවලියක නම් ඔවුන් දිගටම දුගී බවේම හිරවී සිටිනු ඇත. සංවර්ධනය ඔවුන් පසු කරමින් යනු ඇත. එබැවින් කෘෂිකාර්මික නිෂ්පාදකයින් කළ යුත්තේ වාණිජ කෘෂිකර්මය වෙත ළඟා වී, වඩා ලාභ ගෙන දෙන පාරිභෝගික භාණ්ඩ නිපදවීමයි.

කාර්මික ඉදි කිරීමේ සහ සේවා අංශවල ව්‍යාප්ත වූ වර්ධනය සමග ප්‍රාථමික සහ නිමි කෘෂි භාණ්ඩ රාශියකට ඇති දේශීය ඉල්ලුම ඉහල යයි. එමෙන්ම ලෝක වෙළඳ පොලේ ඇති විශාල වාසි සහගත තත්ත්වයෙන් ප්‍රයෝජන ගැනීමට තම නිශ්පාදන විවිධාංග කරණය කිරීමටත් ඒවා නිර්යාත කිරීමටත් කෘෂි නිෂ්පාදකයින් උනන්දු කෙරෙනු ඇත.

මෙම පුළුල් ප්‍රතිපත්තිමය අරමුණු ඉටු කර ගැනීම උදෙසා ආණ්ඩුව ක්‍රියාත්මක කෙරන වැඩ පිළිවෙලේ පහත දැක්වෙන නව ප්‍රතිසංස්කරණ පියවරයන් අඩංගු වෙයි.

* අතීතයේ දී පැවති අසමාන සාර්ව ආර්ථික සහ වෙළඳ ප්‍රතිපත්ති වෙතින් පැන නැගුනු කෘෂිකර්මයට අවාසිදායක සැහවුනු වෙනස් කම් කිරීම් ශීඝ්‍රයෙන් සහ තීරණාත්මක ලෙසම අහෝසි කිරීමට ආණ්ඩුව ඉදිරිපත් වෙනු ඇත.

* කෘෂිකාර්මික වෙළඳපොලවල් සම්බන්ධව ඇති සියළු ආකාරයේ ඒකාධිකාරයන් අහෝසි කර, වඩ වඩාත් තරඟකාරිත්වයට අනුබල දෙනු ඇත.

* නිශ්චිත කාලයක් ඇතුලතදී දේශීය කෘෂිකාර්මික මිළ ගණන් ජාත්‍යන්තර මිළ මට්ටම් වලට සමාන තත්වයකට ගෙන එනු ඇත.

* කෘෂිකාර්මික පර්යේෂණ වෙළඳ පොලට වඩාත් ප්‍රතිචාර දක්වන පරිද්දෙන් ප්‍රතිසංවිධානය කරනු ඇත. ඒ මගින් කෘෂිකාර්මික පර්යේෂණ ආයතන වල කටයුතු

සම්බන්ධව, නිෂ්පාදකයන්ට සහ වෙනත් පෞද්ගලික අංශයේ නියෝජිතයින්ට අවකාශ ලබාදෙනු ඇත. මිළ ගණන් සහ වෙළඳ පොළ ප්‍රවණතා පිළිබඳ තොරතුරු සැපයීම අරමුණු කරගෙන කෘෂිකාර්මික වෙළෙඳ පොළ පර්යේෂණ වැඩ පිළිවෙළක් ද දියත් කරන්නෙමු. මේ පියවරවල් කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීමට ආධාර වනු ඇත.

* වාරිමාර්ග පහසුකම් සැපයීමේ ක්ෂේත්‍රයේ ඇති අති විශාල අයෝජනයන් කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ අතර වඩා සුදුසු වැඩ බෙදීමක් ඇති කිරීමට අපි අදහස් කරන්නෙමු. මහවැලි ජනපද වල සිටින ගොවීන්ගෙන් බොහෝ දෙනෙකු මාසයකට උපයන්නේ රු. 1,500 කට අඩුවෙන් වීම ජාතික අවධානය යොමුවිය යුතු කරුණකි. එම කලාපයේ සිදු කළ අති විශාල ආයෝජන නිර්මානය කර තිබෙන්නේ ආර්ථික සංවර්ධනය වෙනුවට නිරන්තර දුගී කමයි. කාර්යක්‍ෂමතාව ඉහල නැංවීම සඳහා අනාතගයේ දී ඉහල ජලාධාර ප්‍රදේශ හා ජලාශ පාලනය කිරීමේ වගකීම මහවැලි අධිකාරියට ලබා දෙනු ඇත. මේ භාරදූර කාර්යයන් ඉටු කිරීමට මහවැලි අධිකාරියට ඉඩ ලබා දෙනු පිණිස වෙනත් ආයතන වලට කළ හැකි අතිරේක කාර්යයන්ගෙන් අධිකාරිය මුදවන්නෙමු. විශේෂයෙන් ම වාණිජ කටයුතු පුද්ගලික අංශයටත්, ගඟ පහල කටයුතු සහ නඩත්තු කටයුතු අදාල වෙනත් රාජ්‍ය ආයතන වලටත් ගොවි සංවිධාන වලටත් භාරදිය හැකිය.

* ගොවිපල වලින් පිටස්තර රැකියා අවස්ථාවන් ද නිර්මානය කරමින් කෘෂිකාර්මික නිෂ්පාදකයන්ගේ ආදායම් තත්වයන් ඉහල නැංවීම ග්‍රාමීය දුප්පත් කමට ඇති එකම දිගු කාලීන විසඳුම වෙයි. ගොවි ජනපද ආශ්‍රිතව පිහිටි නගර වල රැකියා අවකාශ නිර්මානය කිරීමට ඉහලම ප්‍රමුඛතාවයක් දෙන්නෙමු.. යටිතල පහසුකම් හිගකම නිසා දුර බැහැර ප්‍රදේශ වල අයෝජන කිරීමට පෞද්ගලික අංශය දැනට දක්වන්නේ මැලි කමකි. ග්‍රාමීය ප්‍රදේශ වල මාර්ග සහ

දුරකථන පහසුකම් දියුණු කරන ග්‍රාමීය යටිතල සංවර්ධනය සඳ හා වූ මහා වැඩ පිළිවෙලක් මගින් මෙම ගැටලුවට විසඳුම් යොදා, කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්ත වල ආයෝජනය කරමින් කෘෂිකර්මික නිෂ්පාදනයේ එකතු කරනු ලැබූ වටිනාකම ඉහල නැංවීමට පියවර ගන්නෙමු.

* තම දේපල වලින් ඉහලම ආර්ථික ප්‍රයෝජන ගැනීමට ගොවිජනතාවට අවශ්‍ය නිදහස සහ හැකියාව ලබා දෙන්නෙමු. කෘෂිකාර්මික ජනපද ව්‍යාපර වල ඉඩම් කුලියට දීමට දැනට ඇති සීමාවන් වහාම ඉවත් කරන අතර, ගොවිජනපද ඉඩම් ලාභීන්ට තම ඉඩම් පිළිබඳ නිදහසේ කටයුතු කිරීමට අවකාශ ලබා දෙන්නෙමු. ඉඩම් භාවිතා කිරීම පිළිබඳව දැනට ඇති සීමාවන් ඉවත් කරන්නෙමු.

* වතු වැවිලි අංශයට දීර්ඝ කාලින ප්‍රාග්ධන ආයෝජන මහා පරිමාණ වශයෙන් යෙදවීම හදිසි අවශ්‍යතාවයක් වී තිබේ. වැටුප් තත්වයන් දියුණු කිරීමේ සහ සමාජ යටිතල පහසුකම් තිරසාර ලෙස වර්ධනය කිරීමේ කාර්යයක් වශයෙන් නිෂ්පාදනය වැඩි දියුණු කිරීමට මෙය අත්‍යවශ්‍ය වේ.

* දිගු කාලයක් සඳහා ඉඩම් බදු දීමටත්, ඉඩම් පරිහරණය කිරීමේ වඩා නම්‍යතායක් ඇති කිරීම සඳහාත් දැනට තිබෙන රෙගුලාසි වෙනස් කිරීමට හා අවශ්‍ය සංශෝධන ඇති කිරීමට පියවර ගන්නෙමු. මෙම ඉඩම් බදු ලබා ගැනීම සඳහා වතු අංශයේ දැනට ක්‍රියාත්මක වන සමාගම් වලට සහ නව ආයෝජකයන්ට ඉඩ ලබා දෙන්නෙමු. එම ඉඩම් බද්දට ගැනීමට ඉදිරිපත් වන සමාගම් වලට කොටස් මූල ධනය සැපයීමට සිදුවනු ඇත. අතීතයේ පැවති දුර්වල කළමනාකරණයේ බර ඔවුන් මත නොපැටවීමට අපි වග බලා ගනිමු. මේ අතර, ආණ්ඩුවේ සම්පත් වලට බරක් වී ඇති ආර්ථික ශක්තියක් නැති වතු විකුණනු ඇත. කම්කරුවන් සහ පරිපාලන ඔවුනොවුන් වෙත තිබිය යුතු අන්‍යෝන්‍ය වගකීම මෙන්ම නිෂ්පාදන ධාරිතාව සහ වැටුප් අතර ඇති සම්බන්ධය පිළිගන්නා වතු සමාගම් සහ වෘත්තීය සමිති අතර සාමූහික ගිවිසුම් ඇතිවීම දිරිගන්වන්නෙමු.

* ගොවිපළවල් වල ඇති ජලාශ්‍රිත ප්‍රදේශ මත පදනම් වූ සහ ගොවිපළෙහි සියලු කටයුතු ඒකාග්‍ර සංවර්ධන සැළැස්මකට අනුව සකස් වූ කුඩා ගොවිපළවල් වල, ඉඩම් පරිහරණය පිළිබඳ මනා සම්බන්ධීකරණය සිදු කරන පිළිවෙතක් අනුගමනය කිරීමට ගොවියන් උනන්දු කරවන්නෙමු. ඉඩම් සහ ජලය කළමනාකරණය සඳහා සුදුසු පියවර ගැනීම නිෂ්පාදන ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස සළකා උනන්දු කරවන්නෙමු.

* ඓන්ද්‍රීය පොහොර භාවිතය සහ කෘමීන් පාලනය කිරීම වැනි වෙනත් කෘෂිකාර්මික භාවිතයන් මගින් පොළොවේ සාරවත් බව වර්ධනය කිරීමේ ක්‍රියා මාර්ගයන් මගින්, රසායනික පොහොර සහ වෙනත් කෘෂි රසායනික ද්‍රව්‍ය මත ගොවීන් රැඳී සිටීමේ ප්‍රවණතාවය අඩු කරන්නෙමු.

* ගලායන භූගත සහ අමතර ජලය ප්‍රයෝජනවත් ලෙස පාවිච්චි කිරීමට ඉඩ ලබා දෙන මනා ලෙස සම්බන්ධීකරණය කළ වැඩ පිළිවෙලක්, පරිසර ආරක්ෂාව ගැන නිසි සැළකිල්ල දක්වමින්, සකස් කරන්නෙමු.

* දැනට පවත්නා ගොවි සංවිධාන, සමුකාර හෝ මහජන සමාගම් පදනම යටතේ ප්‍රතිසංවිධානය කරන්න්නෙමු. එහි අරමුණු වනු ඇත්තේ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධීකරණය කිරීමේ සහ ඊට සම්බන්ධ අනෙකුත් කටයුතු අදාල රාජ්‍ය සහ පුද්ගලික අංශයේ සංවිධාන සමඟ සම්බන්ධීකරණය කිරීමේ හැකියාව වර්ධනය කිරීමයි.

* කෘෂි සේවා මධ්‍යස්ථාන නිෂ්පාදන සේවා මධ්‍යස්ථාන හැටියට පත්කරනු සඳහා ප්‍රතිසංවිධානය කරන්නෙමු. ගොවි සංවිධාන වල නියෝජිතයන් සහ නොයෙක් තාක්ෂණික සහ සේවා නියෝජිතයන් නියෝජනය කරන රජයේ නිලධාරීන් විසින් මහජන සහභාගිත්ව පදනම මත ඒවා කළමනාකරණය කරනු ඇත.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

* පර්යේෂණ ව්‍යාප්ති සේවා සහ වෙළඳ පොළ පිළිබඳ තොරතුරු, තත්ව පාලනය පිළිබඳ පුහුණුව සහ මඟ පෙන්වීම, රාජ්‍ය සහ පෞද්ගලික අංශ යන දෙකේම ආයතන සමඟ සම්බන්ධකම් පැවැත්වීම, සහ නීති ආධාර සැපයීම යනාදී ආයතනික සහ තාක්ෂණික සේවාවන් සැපයීම එම මධ්‍යස්ථාන වලට භාරවනු ඇත.

* ඉහත කී ක්‍රියාමාර්ග, මේ වන විට බිඳ වැටී පවතින කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් ප්‍රතිව්‍යුහගත කිරීමට තුඩුදෙනු ඇත.

* ඉඩම්, ජලය, වන සම්පත් සහ ධීවර සම්පත් තිරසාර ලෙස සංවර්ධනය කරනු සඳහා යොදා ගැනීම සහතික කරනු පිණිස පාලනය සහ වෙළඳ පොල දිරි ගැන්වීම් සංයෝග කිරීම මගින් ගොඩනැගෙන පාරිසරික මඟ පෙන්වීම් මාලාවක් ක්‍රියාත්මක කරන්නෙමු.

4. ධීවර කටයුතු

ධීවර අංශය සම්බන්ධව ආණ්ඩුව ගන්නා ප්‍රයත්නයන්ගේ මූලික ගමන් මග වනු ඇත්තේ මත්ස්‍ය නිශ්පාදනයන් නිපදවීම, සකස් කිරීම සහ විකිණීම යන කටයුතු සම්බන්ධව පෞද්ගලික අංශයන් වෙත වඩ වඩාත් විශ්වාසය තැබීම සහ රාජ්‍ය අංශයේ කාර්ය භාරය වෙළඳ පොල මත පදනම් කර සම්පත් කළමනාකරණය සහ පරිපාලනය යලි හැඩ ගැස්වීමයි. සමුද්‍රාසන්න ධීවර කර්මාන්ත අංශයේ සම්පත් සම්බන්ධව දැනට තිබෙන තත්වයන් මගින් පෙන්නුම් කෙරෙන්නේ ධීවර සංවර්ධන උපායේ වෙනසක් දැන් අවශ්‍ය බවයි. මෙම නව උපායෙන් අවධාරණය විය යුත්තේ ධීවර කර්මාන්ත කළමනාකරණය සහ සම්පත් සංරක්ෂණය කිරීම මෙන්ම, ධීවර සම්පත් සහ වෙරළාසන්න ධීවර කටයුතු ආර්ථිකමය වශයෙන් ඵලදායී ලෙස කළමනාකණය කිරීමයි.

ධීවර කර්මාන්තය තවමත් පවතින්නේ විද්‍යාත්මක මත්ස්‍ය වගාවද ඇතුලත් නවීන ධීවර කර්මාන්තයක් හැටියට නොව

හුදෙක් දඩයම් කර්මාන්තයක් හැටියටය. ධීවර ජනතාව අතර ඇති දුගීකම හා ඔවුන්ගේ අඩු නිශ්පාදන හැකියාව මෙම තත්වයට කෙලින්ම දායක වී ඇති කරුණුය. ධීවර කර්මාන්තය නවීකරණය කිරීමේ ප්‍රතිපත්තියක් මගින් ජාතික ආර්ථිකය තුල මෙම අංශයට ලැබී ඇති ස්ථානය ඉහල නැංවීමට අවශ්‍ය පියවර මගේ ආණ්ඩුව විසින් ගනු ලබනු ඇත. පහත සඳහන් ක්‍රියාමාර්ගය ඒ අරමුණු ඉටුකර ගැනීම උදෙසා ක්‍රියාත්මක කරනු ඇත.

* වෙරළාසන්න ධීවර පහසුකම් සැපයීම, ව්‍යාප්ති පර්යේෂණ සහ පුහුණු පහසුකම් සැපයීම, ධීවර වරාය පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීම, නාවුක මාර්ග සහ ආධාර සැපයීම මෙන්ම ආරක්‍ෂණ සහ හදිසි රැකවරණ සැපයීම ද ඇතුලත් වන පරිදි ධීවර අංශයට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට රාජ්‍ය අංශය ඉදිරිපත් වනු ඇත. ගාල්ලේ සහ කිරින්දේ ධීවර වරාය සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය දෙනු ඇත.

* එමෙන්ම ධීවර කර්මාන්තයට අවශ්‍ය සේවාවන් සැපයීම සහ ධීවර ජනතාවගේ සමාජමය ප්‍රතිලාභ උපදවන පරිදි සමුපකාර ව්‍යුහය ශක්තිමත් කිරීම වැනි ධීවර ජනතාවට වාසි ගෙන දෙන ජනසහභාගි ක්‍රියාමාර්ගයන්ට අවධානය යොමු කෙරේ. ඒ මගින් රාජ්‍ය ආධාර මාලාව ධීවර ජනතාවගේ විශාල කොටසකට ලැබීම පහසු කරවනු ඇත.

* ධීවර කර්මාන්තයට අවශ්‍ය නවීන ධීවර බෝට්ටු, ආම්පන්න සහ අනෙකුත් උපකරණ සැපයීම සඳහා විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරන්නෙමු.

* ධීවර සහ ජලජ සම්පත් මෙන්ම ධීවර ජනතාව ද දේශීය මෙන්ම විදේශීය මුහුදු කොල්ලකරුවන්ගෙන් ආරක්‍ෂා කිරීමට අවශ්‍ය නීති රීති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නෙමු.

* ධීවර කාර්මිකයින් නව තාක්‍ෂණය සහ නාවික ගමනා ගමනය සඳහා පුහුණු කිරීම අරමුණු කොටගෙන ජාතික

ධීවර විශ්ව විද්‍යාල ආයතනයක් පිහිටුවන්නෙමු. මේ මගින් අපේ ධීවරයන් දක්ෂ නාවුක යාත්‍රිකයන් බවට ද පත් කළ හැකි අතර, මුහුදු වෙරළ සහ මුහුද ආරක්ෂා කිරීමේ කාර්යය ද ඔවුන්ට පැවරිය හැකි වනු ඇත.

5. යටිතල පහසුකම් සංවර්ධනය

සීඝ්‍ර ආර්ථික සංවර්ධනය සඳහා සැම විටම පුළුල් වන යටිතල පහසුකම් වල සහාය අත්‍යවශ්‍ය වේ. මේ ගැන බලද්දී ශ්‍රී ලංකාව අඩු ආදායම් ලබන රටවල් යටිතල පහසුකම් සඳහා ආයෝජන කරන ප්‍රමාණයට, එනම් දල ජාතික නිෂ්පාදනයෙන් 3% සිට 4 දක්වා වූ ප්‍රමාණයටත් වඩා අඩුවෙන් වියදම් කරන තත්ත්වයකට ඇද වැටීම බිය එළවන සුලුය. ඉහළ ආර්ථික ක්‍රියාකාරිත්වයක් ඇති මලයාසියාව 1981-85 වර්ෂවලදී දල ජාතික නිෂ්පාදනයෙන් 8%ක් පමණ යටිතල පහසුකම් සඳහා ආයෝජනය කල අතර 1986 – 90 කාලයේ දී එය 6%කට වැඩි විය.

මේ අතර යටිතල පහසුකම් සඳහා ශ්‍රී ලංකාවේ ඇති ඉල්ලුම 1990 ගණන් වලදී ශීඝ්‍ර ලෙස ඉහල ගොස් ඇත. උදාහරණයක් වශයෙන්, පසුගිය විසිවසර තුළ විදුලිය බලය සඳහා තිබූ සියයට 7 සිට 8 දක්වා වර්ධනය වූ ඉල්ලුම, 1993 දී 10%කට වඩා වැඩි වාර්ෂික වර්ධන වේගයකින් ඉහළ ගොස් තිබේ. දළ ජාතික නිෂ්පාදිතය අවුරුද්දට 8% බැගින් වේගවත් වෙද්දී, යටිතල පහසුකම් පිළිබඳ අවශ්‍යතා ඊට වඩා වැඩි වේගයකින් ඉහළ යනු ඇත.

දැනට පවතින යටිතල සේවාවන් ලබා දීම කාර්යක්ෂම ලෙස දියුණු කිරීම සිදුකරන ගමන්ම, යටිතල පහසුකම් සඳහා ආයෝජනයන් සීඝ්‍ර ලෙස ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වී තිබේ. දැනටමත් මා දක්වා ඇති අයවැය දුෂ්කරතා නිසා මෙම අංශයේ ආයෝජන කිරීමට ආණ්ඩුවට පමණක් නොහැකිය. එබැවින් යටිතල පහසුකම් වලට මුදල් සැපයීම සහ ඒවා පවත්වා ගැනීම සම්බන්ධව වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට පෞද්ගලික අංශයට සිදුවනු ඇත. මේ අනුව පෞද්ගලික අංශය යටිතල

පහසුකම් "ගොඩනගා ක්‍රියාත්මක කර පසුව ඒවා හිමිකර ගැනීම" හෝ "ගොඩනගා ටික කලක් පවත්වාගෙන ගොස් රජයට පැවරීමේ" ක්‍රමය (බී. ඕ. ඕ./ බී. ඕ. ටී.) අනුගමනය කළ හැකිය. ඊට අමතරව දැනට රජය සතුව පවත්නා ඇතැම් යටිතල සේවාවන්, ඒවා ව්‍යාප්ත කිරීමට නවීකරණය කිරීමට සහ කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය මහා පරිමාණ ආයෝජන කැඳවා ගැනීමේ අදහස ඇතිව පුද්ගලික කරණය කිරීමට ද අවශ්‍ය වනු ඇත.

ඒ අනුව, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහත සඳහන් වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරනු ඇත.

* බී. ඕ. ඕ./ බී. ඕ. ටී. ක්‍රම යටතේ විදුලි බලාගාර ගණනාවක්ම සංවර්ධනය කිරීමට කැමැති පුද්ගලික ආයෝජකයන් සමඟ ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යයෙහි ආණ්ඩුව දැනටමත් නිරත වී ඇත. එයින් එක් ව්‍යාපෘතියක් ලංකාවේ විශාලම විදේශ ආයෝජන ඒකකය බවට පත්වෙනු ඇත. දුරකථන පද්ධතියේ ධාරිතාවය දෙගුණවෙමින් පවතී. ප්‍රධාන පාරවල් වල තද බදය මග හරවා ඒවායේ ධාරිතාව වර්ධනය කරනු පිණිස, ශීඝ්‍රගාමී මාර්ග කිහිපයක්ම, විදේශ ආධාර සහ බී. ඕ. ඕ./ බී. ඕ. ටී ක්‍රම සංයෝගයෙන් ඇති කර ගන්නා සුදුසු පියවරයක් මගින් ගොඩනැගීමේ සැළසුම් සකස්වෙමින් පවතී.

* වරාය සහ නාවුක අංශ ප්‍රධාන වර්ධන කලාප හැටියට සළකනු ලබනු ඇත. කොළඹ සහ ගාලු වරායවල්, ප්‍රධාන වරායවල් බවටත්, අන්තර් නාවුක මධ්‍යස්ථාන බවටත් පත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ ඇති ස්වාභාවික සහ නාවුකමය වශයෙන් වැදගත් තත්ත්වය තවත් ශක්තිමත් කිරීමට ආණ්ඩුව අදහස් කරයි. විදේශ ණය පහසුකම් යටතේ කොළඹ සහ ගාලු වරායවල් පුළුල් කරනු ලැබෙමින් පවතින අතර බී. ඕ. ටී. පදනම යටතේ එන විශාල පරිමාණ විදේශ ආයෝජන මගින් එම ක්‍රියාවලිය තවත් ශක්තිමත් කරනු ඇත.

* ත්‍රිකුණාමල වරාය, නැව් ආශ්‍රිත කර්මාන්ත, සංචාරක කටයුතු සහ පරිසර ආශ්‍රිත කටයුතු සඳහා සංවර්ධනය කරනු ඇත. කන්කසන්තුරේ වරාය යළි ප්‍රයෝජනයට ගනු ලබන අතර, ඔලුවිල් වරාය අලුතින් ඉදි කෙරෙනු ඇත.

* දැනට තිබෙන මූල්‍ය දුෂ්කරතා නොතකා වුවත් නිවාස ක්ෂේත්‍රයෙහි දුන් පොරොන්දු ඉටු කිරීමට ආණ්ඩුව මූලික පියවරයන් තබනු ඇත. පුද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව ස්වයං මූල්‍යකරණ පදනමක් යටතේ නිවාස ගොඩ නැගීමට ආධාර වන යටිතල සහ අනෙකුත් පහසුකම් සැලසීමට අවශ්‍ය සැලැස්මක් ක්‍රියාත්මක කෙරෙනු ඇත. දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට අමතරව ඉඩම්, යටිතල සේවා සහ අනෙකුත් සේවාවන් සපයමින් නාගරිකව ජීවත්වන පහළ ආදායම් ලබන සහ පහළ මධ්‍යම පංතික ජනතාවගේ නිවාස ප්‍රශ්නය තුරන් කිරීමට ආණ්ඩුව රුපියල් මිලියන 240ක් වෙන් කොට ඇත.

අඩු ආදායම් ලබන ග්‍රාමීය ජනතාව තම නිවාස අවශ්‍යතාවයන් ඉටුකර ගැනීම සඳහා යොමු කරනු ලබන්නේ, ඉතිරි කිරීමේ ව්‍යාපෘතීන්ට සහභාගිවීම මගින් නිවාස ණය ලබා ගැනීමට ඔවුන්ට අවකාශ ලබා දීම තුළිනි. වතු ක්ෂේත්‍රයේ නිවාස තත්ත්වය දියුණු කිරීමටද ආණ්ඩුව ආධාර සපයනු ඇත.

රජයට සෘජු මූල්‍ය බරක් ඇති නොකර අඩු වියදමින් මධ්‍යම පන්තික නිවාස ඒකක විශාල ප්‍රමාණයක් ගොඩ නැගීමට ආයෝජනය කිරීම සඳහා විශාල බහුජාතික ආයතන දෙකක් සමඟ අපි සාකච්ඡා පවත්වා ඇත්තෙමු.

6. මානව සම්පත් සංවර්ධනය :— අධ්‍යාපන සහ සෞඛ්‍ය ප්‍රතිපත්තිය

අපේ ජනතාවගේ අධ්‍යාපන සහ සෞඛ්‍ය තත්ත්වයන් ඉහළ නැංවීම මගේ ආණ්ඩුවේ ප්‍රමුඛතාවයකි. සමාජ සමානාත්මතාවය සහ තිරසාර මානව සංවර්ධනය පිළිබඳ අපේ මූලෝපායට ඒවා

කේන්ද්‍රීය කරුණු වෙයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කෙළේ අධ්‍යාපන සහ සෞඛ්‍ය සේවාවන් වෙනුවෙන් කළ වියදම භයානක ලෙස පහළ දැමීමයි. මාගේ ආණ්ඩුවෙන් මෙම ප්‍රවණතාවය ආපස්සට හැරවෙනු ඇත.

ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන ක්ෂේත්‍රයේ ඇති ජයග්‍රහණයන් ජාත්‍යන්තර කීර්තියට පත්වූ ඒවාය. අවුරුදු 70ක ජීවිත අපේක්ෂාව, සියයට 90ක් පමණ වන සාක්ෂරතාවය, සියයට 75 ක් වන ද්විතියික අධ්‍යාපනයට ඇතුළත් වීම සහ සියයට අනූවක් වන ප්‍රාථමික අධ්‍යාපනයට සහභාගී වීම සමහර අදාල දත්තයන්ය. මෙම ජයග්‍රහණයන් ලබාගෙන ඇත්තේ ඉතා ඉහල මට්ටමකින් පැවතුණු සමාජ සුභසාධන වියදම් නිසාය. 1950 සිට 1980 දක්වා වූ දශක තුන තුළ අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සුභ සාධනය සඳහා වූ වියදම දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 9යේ සිට 10 දක්වා වූ සාමාන්‍ය ප්‍රතිශතයක් විය. එසේ වුවත්, 1990 ගණන් වලදී මෙම වියදම් දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 6 දක්වා පහත වැටී තිබේ. අධ්‍යාපන වියදම කපා හැරීම විශේෂයෙන්ම බිය එළවන සුළුය. 1960 ගණන් වලදී දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 4ක් වූ එය 1990 ගණන් වලදී සියයට 2 දක්වාම පහත වැටින. ආණ්ඩුවේ මුළු වියදමේ ප්‍රතිශයක් ලෙස බලන විට අධ්‍යාපනය සඳහා රජය කළ වියදම වඩාත් තියුණු ලෙස පහත වැටී තිබේ. එනම්. සියයට 15 සිට 5 දක්වා අඩු වීමකි. මෙය අධ්‍යාපනය වෙනුවෙන් දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 5.5 කුත්, වාර්ෂික අයවැයෙන් සියයට 18 කුත් වියදම් කරන මැලේසියාවේ පවතින තත්ත්වයට වඩා හත්පසින්ම වෙනස් වූවකි.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයේ තත්ත්වය පිරිහී ගොස් ඇති අතර, එක තැන පල් වුනු උසස් අධ්‍යාපන අංශයට ගතිකත්වයෙන් යුත් ආර්ථිකයකට අවශ්‍ය නිපුණතා සැපයීමට නොහැකි වී තිබේ. පාසැල් සහ පළාත් අතර සම්පත් බෙදී යාම දිගින් දිගටම අසමාන තත්ත්වයකට පත්වී ඇත. වැළැක්විය හැකි ලෙඩ රෝග පැතිරීම ඉහළ යමින් පවතී. මැලේරියාව වසංගතයක් බවට පත්වීමේ තර්ජනය යළිත් මතු වී ඇත. කුඩා දරුවන් අතර මන්ද පෝෂණය ඉහළ මට්ටමකින් පවතී. මෙය අපට කිසිසේත් පිළිගත නොහැකි තත්ත්වයකි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

අධ්‍යාපනයේ තත්ත්වය පිරිහීම වඩාත් බරපතල ලෙස පෙනෙන්නේ ගණිතය, විද්‍යාව සහ විදේශ භාෂා යන අංශවලය. අප නව තාක්ෂණයෙන් යුත් ආර්ථිකයක් කරා ගමන් කරන්නේ නම්, මේවා ගැන ඉහළ නිපුණත්වයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. තෘතීය අධ්‍යාපන අංශය කිසිම ප්‍රසාරණයකට ලක්වී නැත. විශ්ව විද්‍යාලයට ඇතුළත් වන්නේ එම වයස් කණ්ඩායමෙන් සියයට 2.5ක් පමණකි. ඵලදායි රැකියාවන් සඳහා අවශ්‍ය නිපුණතා සැපයීමටද එම අංශය අසමත් වී තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජයට බොහෝ විට සිදු වී තිබෙන්නේ රැකියා සපයන ආයතනයන් හැටියට ක්‍රියා කිරීමටය.

ආණ්ඩුවේ මධ්‍යම කාලීන මූලෝපායෙන් අදහස් කරන්නේ අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට වෙන්කර ඇති සම්පත් ප්‍රමාණය තීරණාත්මක ලෙස ඉහළ දැමීමයි. ඇත්ත වශයෙන්ම මා ඉහත දී කිව් පරිදි, අනිකුත් අංශවල ආයෝජනයේ බර පෞද්ගලික අංශයට පැවරීමට ආණ්ඩුව කටයුතු යොදන්නේ, ආර්ථික ස්ථාවරභාවයට හානි පමුණුවන්නේ නැතිව, අධ්‍යාපනය සහ සෞඛ්‍ය වෙනුවෙන් කරන රජයේ වියදම වැඩිකිරීමටය. මෙම ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ගයන් දියත් කිරීමට ආණ්ඩුව බලාපොරොත්තු වෙයි.

අධ්‍යාපනය :

* රට පුරාම, ගුණාත්මක භාවයෙන් ඉහළ මට්ටමකින් යුත් අධ්‍යාපන පහසුකම් වඩාත් සාධාරණ අන්දමින් ලබා දීමට පියවර අප්‍රමාදව ගනු ඇත. මේ සඳහා යෝග්‍ය වූ ක්‍රමයක් පදනම් කොට අවාසිදායක තත්ත්වයක පවතින පාසැල් වලට හා ප්‍රදේශ වලට අරමුදල් වෙන්කොට දීමේ ක්‍රමයෙහි සංශෝධනයක් ඇති කරනු ඇත.

* අධ්‍යාපනයේ ගුණාත්මක අගය උසස් කිරීම ඉතා හදිසි අවශ්‍යතාවක් වී තිබේ. විෂයමාලා හා ඉගැන්වීමේ ක්‍රම ප්‍රතිශෝධනය කර වඩාත් ඵලදායි තත්ත්වයටත්, අවශ්‍යතාවලට අදාල තත්වයටත් පත් කෙරෙනු ඇත. එම

විෂයමාලා හා ඉගැන්වීමේ ක්‍රම අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ඉතාමත් නවීන භාවියන්ට අනුරූප මට්ටමකට ගෙනෙනු ඇත. මෙහි වැදගත් අරමුණක් වන්නේ, කටපාඩමින් ඉගෙනීමේ නොදියුණු ක්‍රමය තුරන් කිරීමය. ගුරු වෘත්තියට හිමි ගෞරවයත්, වෘත්තීමය චර්යාවනුත් ඊට ලබා දෙනු ඇත. ගුරුවරුන්ට තමන්ගෙන් අපේක්ෂිත උතුම් කාර්යයට ඵලදායීව කැපවී ක්‍රියා කිරීමට හැකිවන අයුරු ඔවුන්ගේ නිපුණතා හා දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට පහසුකම් සහ දිරි ගැන්වීම් ලබා දෙන්නෙමු. මෙම අරමුණ දිනා ගැනීමේ පළමු පියවරක් ලෙසට, දැනටමත් රජය විසින් සියළුම ශ්‍රේණිවල ගුරුවරුන්ගේ වැටුප් වැඩිකර තිබේ.

* මෙහි ඉහත, කාර්මික ප්‍රතිපත්තියට අදාලව සඳහන් කරනලද පරිදිම, වෘත්තීය පුහුණු ක්‍රමයට අවශ්‍ය සම්පත් ලබා දී, රටේ රැකී රක්ෂා පිළිබඳ අවශ්‍යතාවන්ට ගැලපිය හැකි ලෙසට එම ක්‍රමය වැඩි දියුණුවට පත්වීම සහතික කෙරෙනු ඇත.

* තෘතීය අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංවිධානය කර වඩාත් පුළුල් කෙරෙනු ඇත. එය රාජ්‍ය සේවය සඳහා සේවකයින් බිහිකිරීමේ කම්හලක් වශයෙන් පවත්නා තත්වය වෙනස් කොට, පවත්නා කර්මාන්තවලට අදාල රැකියාවන් සඳහා අවශ්‍ය දක්ෂතා ප්‍රගුණ කරන්නාවූත්, උසස් මට්ටමේ පර්යේෂණ කටයුතු හා වෘත්තීමය විශේෂඥතා පෝෂණය කරන්නා වූත්, ක්‍රමයක් බවට පරිවර්තනය කෙරෙනු ඇත.

සෞඛ්‍යය

* සෞඛ්‍ය සේවා අංශයෙහි සිදුවෙමින් තිබෙන මූලධන අයෝජනයේ පිරිහීම වැළැක්වීමට පියවරගනු ඇත.

* රෝග නිවාරණ කටයුතු වලටත්, ප්‍රාථමික මට්ටමේ සෞඛ්‍ය පහසුකම් සැපයීමටත් වැඩි අවධාරණයක් දෙමින් සෞඛ්‍ය

සේවා ක්ෂේත්‍රයේ මුදල් යෙදවීමේ ප්‍රමුඛතා පිළිවෙල වෙනස් කරන්නෙමු. මැලේරියා මර්ධන වැඩ සටහන ප්‍රාණවත්ව ක්‍රියාත්මක කරනු ඇත. සෞඛ්‍ය අංශයේ ගනු ලබන පුරෝගාමී පියවර පරිපූරණය කිරීම සඳහා ජල සම්පාදන හා සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ කටයුතු වැඩිදියුණුවට පත් කෙරෙනු ඇත.

* මධ්‍යම කාලීන වශයෙන්, සෞඛ්‍ය අංශයට අරමුදල් සැපයීම වැඩිකොට වඩාත් දිළිඳු ජන කණ්ඩායම් වලට හා ග්‍රාමීය ප්‍රදේශවලට ප්‍රමාණවත් තරමින් සෞඛ්‍යාරක්ෂක සේවාවක් ලැබීම සහතික වන ආකාරයට එම අරමුදල් වඩාත් හොඳින් යොමු කෙරෙනු ඇත. සෞඛ්‍ය අංශයේ සේවකයන්ගේ වෘත්තියමය දක්ෂතා වැඩිදියුණු වන ලෙසටත්, ඔවුන්ගේ ධෛර්යය හා උද්යෝගය වැඩිදියුණු වන ලෙසටත් ඔවුන්ට පහසුකම් සළසනු ලැබේ.

* වඩාත් දිළිඳු ප්‍රජාවන් අතර සිටින ළමුන් ඉලක්කකොට ගත් සුභසාධක වැඩ සටහන් සමාලෝචනයට ලක්කර ළමුන් අතර පවත්නා බරපතල අන්දමේ මන්දපෝෂණය පිටුදැකීම පිණිස අවශ්‍ය සම්පත් සපයන්නෙමු.

7. සමෘද්ධි වැඩ සටහන – රජයේ සමාජ ආරක්ෂක ජාලය

සෞඛ්‍යය, පෝෂණය, අධ්‍යාපනය හා වෘත්තිය පුහුණුව යන ක්ෂේත්‍රවල සිදුකෙරෙන ආයෝජනයන් මගින් රැකියා ජනිත කිරීමටත්, දිළිඳු ජනතාව අතර මානව සංවර්ධනය වැඩිදියුණු කිරීමටත් දරන ප්‍රයත්නයන්, සමෘද්ධි වැඩ සටහන මාර්ගයෙන් පරිපූරණය කෙරෙනු ඇත. අපට ලබා ගැනීමට ඇති අත්දැකීම් හොඳින් තෝරා බේරාගෙන, එම අවබෝධය මත පදනම් වී සහ ශ්‍රී ලංකාවේ මෙන්ම අනෙක් රටවලද ඇති ඉතා හොඳ භාවිතයන් උපයෝගී කොට ගෙන මෙම වැඩ සටහන සකසා තිබේ. දිළිඳුකම තුරන් කිරීමේ සාර්ථක වැඩ සටහන් වලදී සිදුවන්නේ දිළිඳු ජනයා සහායක කණ්ඩායම් වශයෙන් ස්වාධීනවම සංවිධානය වීමයි.

ඉතිරි කිරීම් වැඩි කිරීමටත්, ව්‍යාපෘතීන් සාර්ථකව දියුණු කිරීමටත්, වඩාත් ඉහළ ස්වශක්තීන් නිර්මාණය වීමටත් එය තුඩු දෙයි. මෙම ක්‍රියාදාමයට රාජ්‍ය නොවන සංවිධාන සහභාගීවීමත් වැදගත් වෙයි. සමෘද්ධි ව්‍යාපාරයට පහත සඳහන් අංග අයත් වෙයි.

* මෙම වැඩසටහන ග්‍රාමීය මට්ටමෙන් අධ්‍යාපනය ලබා ඇති තරුණ තරුණියන් අතුරින් තෝරාගත් සමාජ සංවිධායකයින්ගේ බැඳීම හා කැපවීම ප්‍රයෝජනයට ගනු ඇත. 'සමෘද්ධි නියාමකයන්' වශයෙන් හැඳින්වෙන මෙම සංවිධායකයින් සමෘද්ධි ව්‍යාපාරයේ ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා තම තමන්ගේ ප්‍රදේශවල සමීක්ෂණයක යෙදීමෙන් තම කටයුතු අරඹනු ඇත.

* සමෘද්ධි ව්‍යාපාරයේ ඉලක්කය වන්නේ ආදායම් බෙදී යෑම අනුව බලන විට පහත්ම මට්ටමේ සිටින ජනගහනයෙන් සියයට 30 සිට 35 දක්වා වන ජන සංඛ්‍යාවය. මීට 10,00,000 සිට 12,00,000 දක්වා වන පවුල් සංඛ්‍යාවක් අයත්වන අතර ඔවුන් අතුරින් 7,00,000 සිට 8,50,000 ක් දෙනා අතිශය දිළිඳු මට්ටමේ ජීවත් වෙති. ඔවුන්ගේ ආදායම දීප ව්‍යාප්ත වශයෙන් අවම මට්ටමින් රුපියල් 1,500/- සිට රුපියල් 2,000/- දක්වා වැඩිකිරීමට අදහස් කෙරේ. මේ වැඩ සටහනේ විස්තර, අයවැය කථාවේදී ඉදිරිපත් කෙරෙනු ඇත. ඉතිරි කිරීමේ සංස්කෘතියක් ඇති කරනු පිණිස, මේ ආධාර ලබන්නන්, තම දීමනාවෙන් කොටසක් ඉතිරි කිරීමට උනන්දු කරවනු ඇත.

* ඉතාම දිළිඳු පවුල් සිය කැමැත්තෙන්ම ඉතිරි කරන්නන් හා මතු ණය ලබාගන්නන්/ව්‍යවසායකයන් වශයෙන් බෙදීම අපේක්ෂා කෙරේ. ඉතුරු කරන්නන්ගේ ඉතිරිකිරීම්, පොළියද ලැබෙන පෞද්ගලික ඉතිරිකිරීම් බැංකු ගිණුමක තැන්පත් කෙරෙනු ඇත. පස් (5) වර්ෂයක් අවසානයේදී හෝ අදාළ දිළිඳු පවුලට මාස හයක අඛණ්ඩ කාලයක් තුල මසකට රුපියල් 2,000/- ක ආදායමක් (වෙනත් ආදායම් දීමනා ද ඇතුළුව) ඉපයීමට හැකි වූ අවස්ථාවේ ප්‍රධාන තැන්පත් මුදල ලබාගත හැකි වනු ඇත.

* ව්‍යවසායකයන් ලෙසින් මතු ක්‍රියා කිරිමට බලා පොරොත්තුවෙන් සිටින්නන් ස්වේච්ඡා කණ්ඩායම් ලෙසින් සංවිධානය කරනු ලබන අතර, ඔවුන්ගේ ඉතිරි කිරීම් එක් එක් කණ්ඩායමේ සාමුහික බැංකු ගිණුමේ එකතු වෙනු ඇත. මෙම කණ්ඩායම් විසින් තමන් විසින්ම නිශ්චය කරන අතිරේක මුදල් ප්‍රමාණයක් ද ඉතිරි කරනු ඇත. උදාහරණ වශයෙන්, පවුල් 200 ක් ජීවත් වන ග්‍රාම නිලධාරි කොට්ඨාශයක අතිශයින්ම දිළිඳු පවුල් සංඛ්‍යාව 45කින් සමන්විත වන ඉලක්ක කණ්ඩායමට, එම සියලු දෙනාම ආයෝජකයින් වුවහොත් කෙටි කලකදී රුපියල් 100,000ක් එකතු වේ. එක් එක් ග්‍රාම නිලධාරී ප්‍රදේශයේ සිටින ඉතිරිකිරීම් කණ්ඩායම රුපියල් 60,000ක් ඉතිරිකිරීමේ ඉලක්කයට ලංවන විට, එම කණ්ඩායමේ සිටින ස්වේච්ඡා කණ්ඩායම් වලට සමෘද්ධි සමිතියක් පිහිටුවිය හැකිය. එවිට, සාමාජික පවුල් වලට ණය දීමට ද සමෘද්ධි සමිතියට හැකි වෙයි. ණය ආපසු ගෙවීමේ සංස්කෘතියක් උනන්දු කරවීම අතිශයින්ම වැදගත් කරුණක් වන හෙයින්, කණ්ඩායමේ ඕනෑම පුද්ගලයකුට පළමුව ගෙවන ණය මුදල කණ්ඩායම විසින් සිය කැමැත්තෙන්ම ඉතිරි කරන ලද මුදලින්ම ගෙවනු ලැබේ. මෙහිදී ණය හිමියන් වන්නේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන්ය. මෙම ණය අවශ්‍යයෙන්ම ඉතා හදිසි අවශ්‍යතා පිරිමසා දෙන කුඩා ණය ප්‍රමාණයන් වේ. (වැඩිම වුනොත් මෙම එක් ණය මුදලක් රුපියල් දෙකුන් සීයක් වනු ඇත.)

* මෙම සමෘද්ධි බැංකු දිළිඳු ජනයාගේ අවශ්‍යතා පිරිමසින ගැමි මට්ටමේ ඉතිරිකිරීමේ සංවිධාන හා ආයතන සමග ද, ස.ණ.ස. හා සර්වෝදය බඳු රට පුරා ව්‍යාප්තව සිටින රජයට අයත් නොවන සංවිධාන සමගද සම්බන්ධ වෙනු ඇත. වඩාත් කුඩා ප්‍රදේශයක ක්‍රියාකාරී වන වෙනත් කුඩා ආයතන ද මෙම බැංකු වලට අත්වැල් බැඳගත හැකි ආයතන ගණයෙහි ලා සැළකිය හැකිය. රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරී නොවන ප්‍රදේශවල, සමෘද්ධි බැංකු වලට මහජන බැංකුව වැනි ආයතන සමග එක්විය හැකිය.

කණ්ඩායම් වල ඉතිරිකිරීම් ඔවුන් තෝරා ගන්නා එබඳු කිසියම් ආයතනයකට මාරු කළ පසු, කණ්ඩායමට එම ආයතන වලින් ණය ලබාගත හැකිය. මුල් අවධියේදී ඔවුන්ට ණය ලබාගත හැකි වන්නේ තම කණ්ඩායමේම ඉතිරිකිරීම් වලිනි. පසුව වෙනත් අරමුදල් වලින්ද ණය ලබාගත හැකිය. ජනසවිය භාරකාර අරමුදලේ හවුල් කාර සංවිධාන වලට ලෝක බැංකුව සපයන හා වෙනත් දිළිඳු සහන අරමුදල් වලින් මෙම අතිරේක සම්පත් ලබාගත හැකිය. ජනසවිය භාරකාර අරමුදල ජාතික සංවර්ධන භාරකාර අරමුදල බවට පරිවර්තනය කරනු ඇත. මෙම වැඩ පිළිවෙලට සහභාගී වන සියලු රාජ්‍ය නොවන සංවිධාන, මෙම අරමුදල යටතේ හවුල් කාර තත්ත්වයට පත්වීම උනන්දු කරනු ලැබේ. සමෘද්ධි වැඩ සටහන යටතේ ණය මුදල් දීමේදී මෙම ආයතන වල සම්මතව පවතින ණය දීමේ ව්‍යවහාරයන් හා කාර්ය පරිපාටීන් අනුගමනය කරනු ඇත.

## සමාලෝචනය

ගරු මන්ත්‍රීවරුනි, මගේ ආණ්ඩුවට පැවරී තිබෙන භාරදූර වගකීම වන්නේ පසුගිය ආණ්ඩුවේ ප්‍රචණ්ඩ ක්‍රියා, දූෂණය සහ අකාර්යක්ෂමතාවය නිසා බරපතල ලෙස හානියට පත්වූ දේශපාලන, සමාජ සහ ආර්ථික ව්‍යුහයන් පවතින රටක් පාලනය කිරීමේ කාර්ය භාරයයි.

අපේ රට නිවැරදි මගට යොමු කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ආයතන යළි ගොඩ නැගීමටත්, මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කර, ශක්තිමත් කිරීමටත් අපට සිදු වී තිබේ. එමෙන්ම ආණ්ඩු කිරීමේ ක්‍රියාවලිය විනිවිද පෙනෙන ලෙස විවෘත සහ දූෂණයෙන් තොර එකක් බව සහතික කිරීමත්, දේශපාලන ජීවිතයට සම්බන්ධව සෑම කෙනෙකුම තම කටයුතු සම්බන්ධව වග උත්තර කියන බව සහතික කිරීමත් අපට පැවරී තිබේ.

ආර්ථික වශයෙන් නිරසාර, ආර්ථික සහ මානව සම්පත් වර්ධනය බිහි කරන නිදහස් වෙළඳ පොළ ආර්ථිකයකට අපි කැපවී සිටින්නෙමු. සීඝ්‍ර ආර්ථික වර්ධනය සහ රැකියා අවකාශ

වර්ධනය කරන ගමන්ම, එම ආර්ථිකයේ ප්‍රතිලාභ ද සමාන ලෙස බෙදී යනු ඇත. ආර්ථික වර්ධනයේ ප්‍රධානතම මාධ්‍යය වනු ඇත්තේ පුද්ගලික ව්‍යවසායයි. දුගී ජනතාව ශක්තිමක් ජීවන මාර්ගයක් අත්පත් කර ගන්නා තුරු ඔවුන්ට විශේෂ රැකවරණ සපයන්නෙමු. අපේ ආර්ථික වර්ධන මූලෝපාය සීඝ්‍ර ආර්ථික වර්ධනය ඉලක්ක කරගත්තාවූත්, සමාජමය අරමුණු උදෙසා වෙළඳ පොල මෙහෙයට යොදා ගන්නා වූත් එකකි. "මානුෂික මුහුණුවරකින් යුත් නිදහස් වෙළඳපොල ආර්ථිකයක්" යනුවෙන් අප අදහස් කරන්නේ මෙයයි.

අපේ රට මුහුණ පා ඇති මෙම අභියෝගයේ බැරෑරුම් කම අපට තේරුම් ගත හැක්කේ පසුගිය රජය යෙදී සිටි දූෂණ සහ මූල්‍ය ප්‍රතිපත්තිමය හිතුවක්කාර කමේ තරම දෙස බලන විටය. එසේ වුවත්, මෙම ප්‍රශ්නය විසඳීම සඳහා අප සතු කැප කිරීම කිසි ලෙසකින්වත් නොසැලෙනු ඇත.

අප වෙනුවෙන් මෙන්ම ඊළඟ පරම්පරාව වෙනුවෙනුත් මෙම අරමුණු ඉටු කර ගැනීමට නම් ජනතාවගේ නිරන්තර සහයෝගය අපට අවශ්‍ය ය. අප ලැබූ මහා ජන වරම ඇසට පෙනෙන යථාර්ථයක් බවට පත් කර ගන්නට නම්, ඒ සඳහා උත්සාහ ගැනීමට අපට ප්‍රමාණවත් කාලයක් ලැබිය යුතුය. අවුරුදු 17 ක් මුළුල්ලේ පැවති දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ අයථා පාලනය අප බලයේ සිටි සති 18 ක කෙටි කාලයක් තුළදී නිවැරදි කළ නොහැකිය.

පසුගිය සති කිහිපය තුළ තිබූ වැඩ වර්ජන රැල්ල සහ විශ්මය උපදවන වැටුප් ඉල්ලීම් මේ මොහොතේ සුදුසු ඒවා නොවේ. අවුරුදු 17 ක මර්දනයකට පසු කම්කරුවන්ට තම අයිතිවාසිකම් ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාව මතුවී තිබෙන බවට කිසිදු සැකයක් නැත. එසේ වුවත්, ඉල්ලීම් සහ ඒවා දිනා ගැනීමට යොදා ගන්නා ක්‍රියා මාර්ග ආයතන වසා දැමීමට තුඩුදෙන තරම් අන්තවාදී ඒවා වන්නේ නම්, තම ක්‍රියා මාර්ග කොතරම් වගකීමෙන් යුතු ඒවාදැයි බඟ වලා ගැනීම අත්‍යවශ්‍යය. එසේ සිදුවන්නේ නැත්නම්, අපේ මුළු සංවර්ධන ක්‍රියා දාමයම අනතුරට

පත්වනු ඇත. කම්කරු ආරාවුල් වලින් සිදුවන්නේ අපේ සංවර්ධන ප්‍රතිපත්තියේ මූලික අවශ්‍යතාවයක් වන විදේශ ආයෝජන බිය ගන්වා එළවා දැමීමයි. අති මහත් කැප කිරීම් සහ වේදනාවන් මැද තමන් බලයට පත් කළ ආණ්ඩුව ආරක්‍ෂා කර ගැනීමට ජනතාව පෙළ ගැසී ඉදිරිපත් විය යුතුය. රැකියා බලාපොරොත්තුවෙන් තවත් දශ ලක්‍ෂ ගණන් දෙනා සිටින බව රැකියා තිබෙන අය අමතක නොකළ යුතුය. ආර්ථිකය නිසි ලෙස ක්‍රියාත්මක කරවීමට අඩු තරමින් අවුරුදු දෙකක්වත් අපේ ආණ්ඩුවට අවශ්‍යය. එබැවින් අවුරුදු දෙකක් යනතුරු වැඩි වැටුප් ඉල්ලීම අත් හිටුවීමේ ත්‍රෛපාක්‍ෂික ගිවිසුමකට එළඹෙන ලෙස අපි සියළු සේවක කොටස් වලින් ඉල්ලා සිටිමු. ඒ මගින් අපේ ආර්ථික සංවර්ධන ක්‍රියා මාර්ගය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමටත් දැනට පවත්නා ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් සෙවීමටත් අවශ්‍ය අවකාශ අපට ලැබෙනු ඇත.

අපේ සිහිනය ඉටු කර ගැනීමේදී ඕනෑම අභියෝගයකට මුහුණ දීමට අවශ්‍ය ධෛර්යය සහ අධිෂ්ඨානය අපේ ආණ්ඩුවට තිබේ. අපේ රටේ ජනතාවත් මෙවැනි අභියෝග වලට මුහුණ දීමට එලෙසම සූදානමින් සිටිය යුතුය. එවිට ඒ දුෂ්කර එහෙත් මිහිරි සිහිනය සජීවී යථාර්ථයක් බවට පරිවර්තනය කිරීමට අපට සාමූහිකව කටයුතු කළ හැකිවනු ඇත.

රටටත්, ජනතාවටත් ප්‍රජාතන්ත්‍රවාදය තුළින් සාමය සහ සමෘද්ධිය උදාවේවා !

ජනාධිපති ලේකම් කාර්යාලය
25 AUG 2023
පුස්තකාලය

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

Printed at the Department of Government Printing, Sri Lanka.